# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 26 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ජූලි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 66.75 යි. තැපැල් ගාස්තුව : රු. 18.00 යි.

# 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

[සහතිකය සටහන් කළේ 2002 ජූලි මස 26 වන දින]

එල්. ඩී.–ඕ. 25/2002.

**ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා මත එකතු කළ අගය මත බද්දක් පනවා අයකර ගැනීම පිණිස ද ; ජාතික ආරක්ෂක බද්ද සහ භාණ්ඩ හා සේවා බද්ද අහෝසි කිරීම පිණිස ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 2002 අගෝස්තු 1 වන දින සිට එය ක්‍රියාත්මක විය යුතු ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)

1 වන පරිච්ඡේදය

**එකතු කළ අගය මත බද්ද පැනවීම**

2. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව - (එකතු කළ අගය මත බද්ද පැනවීම.)

(අ) ලියාපදිංචි තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යාමේ දී හෝ කිරීමේ දී, බදු අය කළ හැකි කාලසීමාවක් තුළ ඒ තැනැත්තා විසින් කරනු ලබන සෑම බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමක් මත සැපයුම කරන අවස්ථාවේ දී ම ;

(ආ) එවැනි යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම මත ,

අවස්ථාවෝචිත පරිදි එසේ සපයනු ලබන භාණ්ඩ හෝ සේවාවල හෝ ආනයනය කරන භාණ්ඩවල වටිනාකම අනුව, (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් හැඳින්වෙන බද්දක්,) පහත දැක්වෙන අනුප්‍රමාණ අනුව අයකරනු ලැබිය යුතු ය.

(i) බද්ද අය කළ හැකි, දෙවන උපලේඛනයේ සඳහන්, ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම් නොවන, භාණ්ඩ හා සේවාවල වටිනාකම මත සියයට දහයක්
(එහි බදු ඛණ්ඩය 1/11 ක් වේ)

(ii) බද්ද අය කළ හැකි, ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම් නොවන, අනෙකුත් සියලු බදු අයකළ හැකි භාණ්ඩ හා සේවාවල වටිනාකම මත සියයට විස්සක්.
(එහි බදු ඛණ්ඩය 1/6 ක් වේ.)

බද්ද ඇතුළත් ප්‍රතිෂ්ඨාවක් සම්බන්ධයෙන් වන විට, අය කරන බදු මුදල් ප්‍රමාණය දැනගැනීම පිණිස, ඉහත සඳහන් බදු ඛණ්ඩ අදාළ කරගත යුතු ය.

එසේ වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(අ) 22 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ සඳහන්, දේශීය වශයෙන් ඇහළුම් විකිණීමක් වෙනුවෙන්, නිශ්චිත මුදල අයකරගෙන ඇත්නම්,

(ආ) 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ සඳහන් සැපයුම් වෙනුවෙන් බද්ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විලම්භනය කරනු ලැබ ඇති ඇත්නම්, අවස්ථාවක,

(1) වන උපවගන්තිය යටතේ බද්දක් අයකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි යම් තේ නිෂ්පාදකයකු විසින්, ලියාපදිංචි තේ බ්‍රෝකර්වරයකු පවත්වන යම් වෙන්දේසියකට සපයන ලද තේ, එම බ්‍රෝකර්වරයා විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ ලියාපදිංචි තේ අපනයනකරුවකුට සපයා ඇත්නම් එම තේ බ්‍රෝකර්වරයා විසින්, කොමසාරිස් ජනරාල්වරයා නියම කර ඇති පරිදි එම තේ බැහැර කිරීම පිළිබඳව සැසඳුම් සපයන තෙක්, එම තේ සඳහා අයවිය යුතු බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් විලම්භනය කරනු ලැබිය යුතු ය.

(3) භාණ්ඩ ආනයනය මත වූ බද්ද තීරු බද්දක් වූවාක් මෙන් ද ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සියලු භාණ්ඩ බද්දට සහ තීරු බද්දට යටත් වූවාක් මෙන් ද පනවා අයකර ගත යුතු ය :

එසේ වුව ද, -

(අ) රේගු බන්ධිත ප්‍රදේශයට ඇතුළු කරන ලද යම් භාණ්ඩ මත ;

(ආ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා ඇඟළුම් නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු විසින් අපනයනය කිරීම සඳහා ඇඟළුම් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා එම තැනැත්තා විසින් අපනයනය කරනු ලබන රෙදිවලට සහ ආනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතිව එකතු කළ වටිනාකමක් සහිතව හෝ රහිතව එම රෙදි වෙනත් යම් තැනැත්තකුට යවනු ලබන අවස්ථාවක දී එම රෙදිවලට ;

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ වෙනත් ඇඟලුම් නිෂ්පාදකයන් මාර්ගයෙන් ඇඟලුම් නිෂ්පාදනය කර අපනයනය කිරීමේ කාර්ය සඳහා වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලැබුවා වූ ද, අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතය ඇතිව එම නිෂ්පාදකයන් වෙත යවනු ලැබුවා වූ ද රෙදිවලට ;

(ඈ) රෙදි නිෂ්පාදනය කිරීමේ කාර්ය සඳහා 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් රෙදි නිෂ්පාදකයකු විසින් ආනයනය කරනු ලැබුවා වූ ද, රෙදි නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන කෙඳි වර්ග, නූල්, අමුරෙදි, නිම කරන ලද රෙදි, රසායන ද්‍රව්‍ය සහ ඩයි වර්ගවලට ;

(ඉ) යම් නැවකට,

කිසිම බද්දක් අයකරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, තවදුරටත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) (i) භාණ්ඩ නිෂ්පාදනය කර, එසේ නිෂ්පාදනය කරන භාණ්ඩ අපනයනය කිරීමේ කාර්ය සඳහා පාවිච්චි කිරීම පිණිස, බන්ධිත ප්‍රදේශයකින් ලැබෙන භාණ්ඩ ද ඇතුළුව, යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරන හෝ යම් ලියාපදිංචි තැනැත්තකුට ලැබෙන භාණ්ඩ සඳහා ;

(ii) ව්‍යාපෘතියකට සම්බන්ධව 22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ සඳහන්, යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය තුළ ;

(iii) ප්‍රධාන වශයෙන්, විදේශීය ආණ්ඩුවක් විසින් හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ඊට අනුබද්ධ ඒජන්සි ඇතුළුව, යම් ප්‍රාදේශීය හෝ බහු පාර්ශ්වික ඒජන්සියක් විසින් අරමුදල් සපයනු ලබන යම් යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සඳහා ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ ආනයනය කරන යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර වන යම් භාණ්ඩ ;

(iv) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු විසින් නිෂ්පාදනය කරන රෙදි, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති වෙනත් තැනැත්තකු විසින් මිල දී ගෙන අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී එම රෙදි මත,

අයවිය යුතු බද්ද ගෙවීම, ඒ භාණ්ඩ ආනයනය කරනු ලැබූ හෝ ලැබුණු හෝ මිල දී ගත් දින සිට දවස් හැටක කාලයක් සඳහා හෝ අමාත්‍යවරයා විසින් ගැසට්

පත්‍රයේ පළ කරන නියමයක් මගින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, දවස් අනූවක් නොඉක්මවන කාලයක් සඳහා හෝ විලම්භනය කරනු ලැබිය හැකි ය ;

(ආ) ශ්‍රී ලංකාවට තාවකාලිකව ආනයනය කර, මාස දොළහක් ඇතුළත නැවත අපනයනය කරනු ලබන ඉහළ වටිනාකමක් ඇති පිරියත, යන්ත්‍ර හෝ අනෙකුත් උපකරණ නැවත අපනයනය කරන දිනය දක්වා කාලසීමාව සඳහා,

එසේ ආනයනය කරන හෝ ලැබෙන හෝ මිල දී ගත් භාණ්ඩ සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය, බැංකු ඇපකරයක් හෝ සමාගම් ඇපකරයක් සැපයීමට යටත්ව විලම්භනය කරනු ලැබිය හැකි ය.

තොග වශයෙන් හෝ සිල්ලරට භාණ්ඩ සැපයීම වෙනුවෙන් බදු අය නොකළ යුතු බව.

3. 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, යම් භාණ්ඩ තොග හෝ සිල්ලර වශයෙන් කරන සැපයීම් සම්බන්ධයෙන්–

(අ) ඒවායේ නිෂ්පාදකයන් විසින් ; හෝ

(ආ) ඒවා ආනයනකරුවන් විසින් ; හෝ

(ඇ) සපයනු ලබන ඒ භාණ්ඩ ලබාගත් ප්‍රභවය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් කිරීමට අපොහොසත් වන සැපයුම්කරුවකු විසින්,

හැර, තොග හෝ සිල්ලර වශයෙන් භාණ්ඩ සැපයීම වෙනුවෙන් බද්ද අයකරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද,

(අ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ඒ බවට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබුවහොත් ;

(ආ) වෙනත් යම් තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ බවට ඉල්ලීමක් කර 10 වන හෝ 12 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි ලියාපදිංචිය ලබාගතහොත්,

එසේ තොග වශයෙන් හෝ සිල්ලරට භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් බද්ද අයකරනු ලැබිය යුතු ය.

සැපයීමේ වේලාව.

4. (1) භාණ්ඩ සැපයීම, මෙහි පහත සඳහන් සිදුවීම් අතුරෙන් පළමුව සිදුවන්නේ යම් සිද්ධියක් ද ඒ සිද්ධිය සිදු වූ අවස්ථාවේ දී සිදුවන ලද ලෙස සැලකිය යුතු ය :—

(අ) සැපයුම්කරු විසින් භාණ්ඩ සඳහා ඉන්වොයිසි පත්‍රයක් නිකුත් කිරීම ; හෝ

(ආ) සැපයුම්කරුට භාණ්ඩ සඳහා, යම් අත්තිකාරමක් ඇතුළු ගෙවීමක් ලැබීම ; හෝ

(ඇ) ඒ සැපයුම සඳහා භාණ්ඩ වෙනුවෙන් ගෙවීමක් සැපයුම්කරුට ලැබිය යුතු වීම ; හෝ

(ඈ) භාණ්ඩ භාරදීම සිදු කිරීම,

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, යම් භාණ්ඩ භාරදීම සිදු කළ දින සිට දවස් දහයක් ඇතුළත, එසේ සපයන ලද එම භාණ්ඩ සඳහා ඉන්වොයිසියක් නිකුත් කළ අවස්ථාවක, ඒ ඉන්වොයිසිය නිකුත් කරනු ලැබූ වේලාව, ඒ භාණ්ඩ සපයනු ලැබූ වේලාව ලෙස සැලකිය යුතු ය.

(3) සේවා සැපයීම–

(අ) ඒ සේවාව ඉටු කළ විට ; හෝ

(ආ) ඒ සේවා සඳහා හෝ අනාගත සේවා සඳහා හෝ ගෙවීමක් ලැබුණු විට ; හෝ

(ඇ) ඒ සේවා සඳහා හෝ අනාගත සේවා සඳහා හෝ ගෙවීමක් අය විය යුතු වූ විට ; හෝ

(ඈ) ඒ සේවා සම්බන්ධයෙන් ඉන්වොයිසියක් නිකුත් කළ විට,

යන අවස්ථාවලින් කලින් එළඹෙන අවස්ථාවේ දී සිදු වූ ලෙස සැලකිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද යම් සේවාවක් ඉටු කිරීම සිදු කළ දින සිට දවස් දහයක් ඇතුළත, සපයන ලද එම සේවාව සඳහා ඉන්වොයිසියක් නිකුත් කළ අවස්ථාවක, ඒ ඉන්වොයිසිය නිකුත් කරනු ලැබූ වේලාව, ඒ සේවාව ඉටු කරනු ලැබූ වේලාව ලෙස සැලකිය යුතු ය.

(5) (1) වන හා (3) වන උපවගන්තිවල කවර විධිවිධානයක් තිබුණ ද පහත දැක්වෙන අවස්ථාවල දී, එනම්—

(අ) නියත කාලීන ගෙවීම් සඳහා විධිවිධාන ඇතුළත් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ නොවන, 1998 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ඇතුළත් වන ලද ගිවිසුමක් යටතේ සැපයුමක් කරන අවස්ථාවක දී, ගෙවීම අයවිය යුතු වීම හෝ ගෙවීම ලැබීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාවේ දී ; සහ

(ආ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ සපයන අවස්ථාවක, ගිවිසුමට එළඹුන අවස්ථාවේ දී,

සැපයුමක් සිදු වූ ලෙස සැලකිය යුතු ය.

(6) 23 වන වගන්තිය යටතේ ගෙවීම් ලැබීමේ පදනම මත බද්ද පිළිබඳ ගිණුම් ඉදිරිපත් කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා යම් ලියාපදිංචි තැනැත්තකුට විධානය කරන ලද අවස්ථාවක, ඒ තැනැත්තාට භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ගෙවීම් ලැබුණු වේලාව ඒ තැනැත්තා විසින් භාණ්ඩ හා සේවා සැපයූ වේලාව ලෙස සැලකිය යුතු ය.

(7) සැපයුම සිදු කරන වේලාව, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ, 2002 ජූලි 31 දින දී හෝ ඊට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් හෝ ඒ කාලසීමාවකින් කොටසක් තුළට වැටෙන සහ 4 වන වගන්තියේ සඳහන් යම් සිද්ධියක් එම සැපයුම හා සම්බන්ධව මේ පනත යටතේ සිදු වූ අවස්ථාවක, ඒ දෙවනුව සඳහන් කළ සිදුවීම, සැපයුම සිදු වූ වේලාව ලෙස නොසැලකිය යුතු ය.

5. (1) බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුමක වටිනාකම– භාණ්ඩ හෝ සේවා සැපයුමේ වටිනාකම.

(අ) සැපයුම, මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා වන්නේ නම්, එම ප්‍රතිෂ්ඨාවෙන් මේ පනත යටතේ අය කළ යුතු යම් බදු මුදලක් අඩු කළ පසු විවෘත වෙළෙඳපොළේ වටිනාකමට නොඅඩු ඒ ප්‍රමාණය ප්‍රතිෂ්ඨාව විය යුතු ය ;

(ආ) සැපයුම මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා නොවන්නේ නම් හෝ ප්‍රතිෂ්ඨාව සම්පූර්ණයෙන් මුදලින් සංයුක්ත නොවන්නේ නම්, ඒ සැපයුමෙහි වෙළෙඳපොළ වටිනාකම විය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව භාණ්ඩ හෝ සේවා සැපයුමක් ලියාපදිංචි තැනැත්තකු නොවන තැනැත්තකුට ලියාපදිංචි තැනැත්තකු විසින් විවෘත වෙළෙඳපොළ වටිනාකමකට අඩු මුදල් ප්‍රමාණයකට කරන්නා වූ අවස්ථාවක, ඒ සැපයුමෙහි වටිනාකම, එම සැපයුමෙහි විවෘත වෙළෙඳපොළ වටිනාකම විය යුතු ය.

(3) සේවා යෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තයාට සේවා නියුක්තියෙන් ලැබෙන ප්‍රතිලාභයක් වශයෙන් භාණ්ඩ හෝ සේවා සපයනු ලබන අවස්ථාවක, ඒ සැපයුම සඳහා මුදල් වටිනාකම, ඒ සැපයුමෙහි විවෘත වෙළෙඳපොළෙහි වටිනාකම හෝ ඒ සැපයුමෙහි විවෘත වෙළෙඳපොළ වටිනාකම නිශ්චය කළ නොහැකි අවස්ථාවක, වෙනත් යම් සේවා නියුක්තයකු විසින් භුක්ති විඳිනු ලබන ඊට සමාන ප්‍රතිලාභයක පිරිවැය ලෙස තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලබන පිරිවැය විය යුතු ය.

(4) සේවා සැපයුමක්, යම් ලොතරැයියක් හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම්වලට ඇතුළත්වීමේ හෝ ගනුදෙනු කිරීමේ යම් බදු අය කළ හැකි ක්‍රියාත්තක් යටතේ හෝ එවැනිම ස්වභාවයේ යම් ව්‍යාපාරයක් යටතේ කෙරෙන අවස්ථාවක, ඒ සැපයීමේ වටිනාකම, ඒ සැපයුම වෙනුවෙන් ලැබිය යුතු මුලු මුදලින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ලොතරැයියේ දී හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම්වල දී හෝ ඒ ස්වභාවයේ යම් ව්‍යාපාරයක දී හෝ දෙනු ලබන තෑගි හෝ දිනුම් මුදල්වල ප්‍රතිශ්ඨාව අඩු කළ විට ලැබෙන මුදල විය යුතු ය.

(5) භාණ්ඩ හෝ සේවා සැපයුමක්–

(i) 16 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරන වේලාවේ දී තැනැත්තකු විසින් කරනු ලබන අවස්ථාවක ; හෝ

(ii) 8 වන වගන්තිය යටතේ නිදහස් කරනු ලබන සැපයුම් කරන යම් තැනැත්තකුට කරනු ලබන අවස්ථාවක ; හෝ

(iii) ලියාපදිංචි තැනැත්තකු නොවන හෝ ලියාපදිංචි තැනැත්තකුව සිටිමින් 3 වන වගන්තියේ අතුරු විධානය යටතේ බදු අයකරනු ලැබීම සඳහා මනාපය පළකර නොමැති තැනැත්තකු වන යම් තොග හෝ සිල්ලර වෙළෙඳාමක් කරගෙන යන හෝ කරන තැනැත්තකු විසින් කරනු ලබන අවස්ථාවක ; හෝ

(iv) සැපයුම්කරු විසින් ඔහුගේ පෞද්ගලික පාවිච්චිය සඳහා හෝ බදු අය කළ හැකි සැපයුමක් හැර වෙනත් කාර්යයකට යොදා ගන්නා අවස්ථාවක,

ඒ සැපයුමේ වටිනාකම, විවෘත වෙළෙඳපොළෙහි එහි වටිනාකමට වඩා අඩු ප්‍රමාණයක් නොවිය යුතු ය.

(6) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ සැපයුමක වටිනාකම, 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරන ලද මුදල් මිල විය යුතු අතර විවෘත වෙළෙඳපොළේ වටිනාකමට අඩු නොවිය යුතු ය :

එසේ වුව ද, කුලී සින්නක්කර ගිවිසුමක් පිළිබඳ කාරණයක දී–

(අ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සපයන යම් භාණ්ඩවල මුදල් මිලට, ඒ ගිවිසුම යටතේ සපයනු ලබන භාණ්ඩවල විකුණුම්කරුගෙන් එම භාණ්ඩ සැපයුම්කරු අයකර තිබෙන බද්ද ඇතුළත් වන්නා වූ සහ මේ පනත යටතේ ලියාපදිංචි නොවූ තැනැත්තකු වීම නිසා යෙදවුම් බදු බැර ඉල්ලා සිටීමට විකුණුම්කරුට නොහැකි වන්නා වූ අවස්ථාවක, විකුණුම්කරුගෙන් එලෙස අයකරනු ලැබූ බද්ද අඩු කිරීමෙන්, බද්ද අයකිරීමේ කාර්ය සඳහා, මුදල් මිල සහ වෙළෙඳපොළ වටිනාකම ගැලපිය යුතු ය ;

(ආ) ඒ ගිවිසුම මගින්, අවුරුදු එකකට වැඩි කාලයක් තුළ සංසරණයේ පැවති වරක් පාවිච්චි කළ භාණ්ඩ සැපයීමේ දී, බද්ද අයකිරීමේ කාර්යය සඳහා ඒ භාණ්ඩවල මුදල් මිල සහ වෙළෙඳපොළ වටිනාකම විය යුත්තේ කුලී සින්නක්කර ගිවිසුමෙහි ඒ භාණ්ඩ සඳහා නිශ්චිතව සඳහන් වටිනාකමින්, ඒ කුලී සින්නක්කර පහසුකම සඳහා අය කරනු ලබන, ඒ ගිවිසුමෙහි ඇතුළත් යම් ගාස්තු අඩු කිරීමෙන් පසු මුදල ය.

(7) ඉඩම් හා එහි වැඩිදියුණු කිරීම්වල සැපයුමේ වටිනාකම, සැපයුම කරන අවස්ථාවේ දී ඒ ඉඩමේ වටිනාකම සහ ඒ ඉඩමේ 1998 මාර්තු 31 වන දිනට කරන ලද යම් වැඩි දියුණු කිරීමක වටිනාකම අඩු කිරීමෙන් පසු ඒ සැපයුමේ වටිනාකම විය යුතු

අතර, එය එදිනට වෙළඳපොළ වටිනාකමින් ඒ ඉඩමේ වටිනාකම සහ 1998 මාර්තු 31 වන දිනට කරන ලද යම් වැඩිදියුණු කිරීමක වටිනාකම අඩු කිරීමෙන් පසු වටිනාකමට වඩා අඩු නොවිය යුතු ය.

(8) විකට්පතක් නිකුත් කිරීම මත හෝ මුදල් තැන්පත් කිරීම මගින් භාණ්ඩ හා සේවා සපයන අවස්ථාවක, ඒ සැපයුමේ වටිනාකම, අවස්ථාවෝචිත පරිදි ඒ විකට්පතට ගෙවූ මුදලින් මේ පනත යටතේ ගෙවිය යුතු බද්ද අඩුකළ පසු මුදල හෝ ආපසු ගෙවිය යුතු යම් මුදලක් නොවන, තැන්පත් කළ මුදලින්, මේ පනත යටතේ ගෙවිය යුතු බද්ද අඩුකළ පසු මුදල විය යුතු ය.

(9) කුලී-සින්නක්කර ගිවිසුමක් නොවන 1998 අප්‍රේල් 1 වන දිනට පෙරාතුව ඇතුළත් වන ලද සමාලෝචනය කළ නොහැකි ගිවිසුමක් යටතේ වූ සැපයුමක වටිනාකම, ඒ ගිවිසුම යටතේ යම් බදු අය කළ හැකි කාලයක් සඳහා ගෙවිය යුතු හෝ ගෙවන ලද මුළු මුදල විය යුතු අතර එය බදු ඇතුළත් ප්‍රතිෂ්ඨාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) බදු ගිවිසුමක් යටතේ සපයන ලද යම් භාණ්ඩ, බද්දේ කාලය ඉකුත් වූ විට එම බදු ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාවෙන් සියයට දහයක් නොඉක්මවන ප්‍රතිෂ්ඨාවකට බදු ගැනුම්කරුට පැවරූ අවස්ථාවක, ඒ ප්‍රතිෂ්ඨාව ඒ බදු ගිවිසුම යටතේ අයකර ගන්නා ලද බදු කුලියක් ලෙස සැලකිය යුතු ය.

තවද ඒ ප්‍රතිෂ්ඨාව, බදු ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාවෙන් සියයට දහයෙන් එකකට වැඩි වන අවස්ථාවක, ඒ සැපයුම, වෙනම සැපයුමක් ලෙස සැලකිය යුතු ය.

(11) භාණ්ඩ හෝ සේවා සැපයුමක් සම්බන්ධයෙන් වූ ප්‍රතිෂ්ඨාව, බදු අය කළ හැකි සැපයුමකට සහ බදු අය කළ නොහැකි සැපයුමක් වන සැපයුමකට අදාළ වන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි සැපයුම සඳහා වූ ප්‍රතිෂ්ඨාව, ඒ බදු අය කළ හැකි සැපයුමට ආරෝපිත වටිනාකමේ කොටස ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ඒ බදු අයකළ හැකි සැපයුමේ වෙළෙඳපොළ වටිනාකමට අඩු නොවිය යුතු ය.

(12) සැපයුම්කරුගේ හෝ වෙනත් තැනැත්තකුගේ හෝ වෙනත් භාණ්ඩ ප්‍රයෝජනයට ගෙන භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන හෝ සාදනු ලබන නැතහොත් සේවා සපයනු ලබන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එකී වෙනත් භාණ්ඩ එම නිෂ්පාදනයේ දී

හෝ සෑදීමේ දී හෝ සේවා සැපයීමේ දී ප්‍රයෝජනයට ගනු ලබන ලෙස සැලකිය යුතු අතර, එසේ නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද භාණ්ඩ සැපයුමෙහි සහ එම නිෂ්පාදනය හෝ සෑදීම හා සම්බන්ධ සේවා සැපයුමෙහි වටිනාකම හෝ සේවා සැපයුමෙහි වටිනාකම, ඒ සැපයුමෙහි විවෘත වෙළෙඳපොළ වටිනාකම හෝ ඒ සැපයුම සඳහා ලැබුණු ප්‍රතිෂ්ඨාවේ මුදල යන මෙයින් වඩා ඉහළ වටිනාකම විය යුතු ය :

එසේ වුව ද, භාණ්ඩ සැපයුම සහ සේවා සැපයුම වෙන වෙනම සැපයුම් දෙකක් බව තක්සේරුකරු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, එවිට ඒ එක් එක් සැපයුම වෙන වෙනම සැපයුමක් ලෙස, තක්සේරුකරු විසින් සලකනු ලැබිය යුතු ය.

6\. ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම – (ආනයනය කළ භාණ්ඩවල වටිනාකම.)

(අ) තීරු බදු කාර්ය සඳහා තීරණය කරන ලද භාණ්ඩවල වටිනාකම ; සහ

(ආ) ඒ භාණ්ඩ සඳහා ගෙවිය යුතු යම් තීරු බදු මුදලට ගෙවිය යුතු යම් අධිභාරයක්, සෙස් බද්දක් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ද ඇතුළුව ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

යන දෙකෙහි එකතුව විය යුතු ය.

7\. (1) භාණ්ඩ සැපයුමක් – (ශූන්‍ය අනුප්‍රමාණගත කිරීම.)

(අ) එම භාණ්ඩ සැපයුම්කරු විසින් අපනයනය කරනු ලැබ ඇති අවස්ථාවක දී ශූන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය ;

(ආ) සේවා සැපයුමක දී –

(i) ශ්‍රී ලංකාවෙන් පිටත යම් නිශ්චල හෝ චංචල දේපළකට ;

(ii) යම් විදේශීය නෞකාවක් හෝ ගුවන් යානයක් අලුත්වැඩියා කිරීමකට, මුහුදු නැව්බඩු කන්ටේනරයක් යථාවත් කිරීමට හෝ නැවත අපනයනය සඳහා ආනයනය කර ඇති වෙනත් යම් භාණ්ඩවලට ;

(iii) ප්‍රකාශන අයිතියක්, පේටන්ට් අයිතියක්, බලපත්‍රයක්, වෙළෙඳ ලකුණක් හෝ ඒ හා සමාන බුද්ධිමය දේපළ අයිතියක් ශ්‍රී ලංකාවෙන් පිටත දී භාවිත කිරීම සඳහා වන තාක් දුරට, ඒ අයිතියකට ;

(iv) ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන, භාණ්ඩ හෝ මගීන් (ප්‍රතිනැව්ගත කිරීම ඇතුළුව) ජාත්‍යන්තර ප්‍රවාහනයකට ;

(v) මුළුමනින්ම ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම සඳහා පරිගණක මෘදුකාංග නිර්මාණකරුවකු තමා විසින් නිර්මාණය කරනු ලබන මෘදුකාංග සම්බන්ධයෙන් සහ බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන සහ සේවා සැපයීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිද්දෙන් ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක පමණක් ඒ මෘදුකාංග නිර්මාණකරු ;

(vi) බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන ශ්‍රී ලංකාවෙන් පිටත හඳුනාගත් එක් සේවාපේක්ෂකයකුට හෝ සේවාපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවකට අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ අනන්‍යව සේවාපේක්ෂක ආධාරක සේවා සැපයුම පිණිස 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පිහිටුවන ලද ව්‍යවසායක් විසින් අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ සපයන සේවාපේක්ෂක ආධාරක සේවා ;

(vii) ශ්‍රී ලංකාවේ බැංකුවක් මගින් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබන තාක් දුරට, ශ්‍රී ලංකාවෙන් පිටත දී පාවිච්චි කරනු ලබන වෙනත් යම් සේවා,

සෘජු සම්බන්ධයක් ඇතිව සේවා සපයන අවස්ථාවක එම සේවා සැපයුම ශුන්‍ය අනුප්‍රමාණගත කළ යුතු ය.

(2) ලියාපදිංචි තැනැත්තකු විසින් යම් ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ හෝ සේවා සපයනු ලබන අවස්ථාවක –

(අ) ඒ සැපයුම සම්බන්ධයෙන් කිසි බද්දක් අය නොකළ යුතු ය ;

(ආ) අනෙකුත් සියලු කරුණු සම්බන්ධයෙන් ඒ සැපයුම බදු අය කළ හැකි සැපයුමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ සැපයුම මත බදු අය කරන අනුප්‍රමාණය ශුන්‍ය විය යුතු ය.

සැපයුම් සහ ආනයන බද්දෙන් නිදහස් කිරීම.

**8.** මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් භාණ්ඩ හෝ සේවා සැපයුමක් සහ භාණ්ඩ ආනයනයක් බද්දට යටත් නොවන හෙයින් 7 වන වගන්තිය යටතේ එම සැපයුම් ශුන්‍ය අනුප්‍රමාණගත වන්නේ නම් හැර, ඒ මත කිසි බද්දක් අය නොකළ යුතු ය.

ශ්‍රී ලංකාව තුළ සපයනු ලබන භාණ්ඩ හා සේවා.

**9.** සැපයුම්කරු, බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් ශ්‍රී ලංකාව තුළ කරගෙන යන විට සහ කරනු ලබන ඒ සැපයුම කරන අවස්ථාවේ දී ඒ භාණ්ඩ ශ්‍රී ලංකාවෙහි වේ නම් හෝ සැපයුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් ශ්‍රී ලංකාවෙහි ඒ සේවා සැපයුම කර ඇත්නම් මේ පනතේ කාර්ය සඳහා ඒ භාණ්ඩ හෝ සේවා ශ්‍රී ලංකාවේ දී සපයනු ලබන ලෙස සැලකිය යුතු ය.

## II වන පරිච්ඡේදය

## ලියාපදිංචි කිරීම

බදු අය කළ හැකි ක්‍රියාකාරකමක දී සැපයුම් කරන තැනැත්තන් ලියාපදිංචි කළ යුතු බව.

**10.** (1) 2002 අගෝස්තු මස 1 වන දින හෝ ඉන් පසු, යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුළ කරගෙන යන හෝ කරන සෑම තැනැත්තකුම –

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාවක් අවසානයේ දී ශ්‍රී ලංකාව තුළ, අවස්ථාවෝචිත පරිදි එකී බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත ඔහු විසින් කරන ලද භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවා ඇත්නම් ; හෝ

(ආ) එවකට අවසාන වන මාස දොළහක කාලසීමාව තුළ, ඔහු ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ දහඅටක් ඉක්මවා ඇත්නම් ; හෝ

(ඇ) ඊළඟ එක් එක් මාසයක හෝ මාස තුනක බදු අය කළ හැකි කාලසීමාව තුළ අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවෙහි ඔහුගේ භාණ්ඩ හෝ සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ ඉන් ඉක්බිතිව වූ බදු අය කළ හැකි මාස දොළහ තුළ රුපියල් ලක්ෂ දහ අටක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට, යම් අවස්ථාවක, යුක්තිසහගත හේතු ඇත්නම්,

මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය :

එසේ වුවද, භාණ්ඩ සැපයුම හුදකළා ගනුදෙනුවක් හා සම්බන්ධ බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, මේ වගන්තියේ කාර්ය සඳහා, බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම ගණන් බැලීමේ දී, ඒ සැපයුමෙහි වටිනාකම අත් හරිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් සෑම තැනැත්තකුම, ඔහු එසේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් වූ දින සිට දින පහළොවකට වඩා පමා නොවී, නිශ්චිත ආකෘති පත්‍රයෙහි වූ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා, බදු අය කළ හැකි මුළු සැපයුම්වල වටිනාකමට 3 වන වගන්තිය යටතේ බදු ගෙවීමෙන් බැහැර කරනු ලැබූ යම් තොග හෝ සිල්ලර වෙළෙඳ ක්‍රියාකාරකමක සැපයුම් ඇතුළත් නොවිය යුතු ය.

භාණ්ඩ ආනයනය කරන්නන් විසින් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දිය යුතු බව.

11. (1) ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කරන්නකු වන සෑම තැනැත්තකුම ඒ භාණ්ඩ නිෂ්කාශණය කිරීමට පෙර දින දහහතරකට වඩා පමා නොවී, තමා ඒ භාණ්ඩ ආනයනය කළ බව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමට ද ඒ භාණ්ඩ නිෂ්කාශණය සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීමට ද යටත් විය යුතු ය :

එසේ වුවද, රේගු ආඥාපනතේ 107 වන වගන්තිය යටතේ සාදන ලද මගී ගමන් බඩු (නිදහස් කිරීමේ) නියෝග යටතේ ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කරන යම් ආනයනකරුවකු නැතහොත් මේ පනතේ 10 වන වගන්තිය යටතේ හෝ 12 වන වගන්තිය යටතේ හෝ 14 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ 77 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන තැනැත්තකු නැතහොත් 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 75 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස සැලකෙන තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීමට යටත් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීමට සහ හඳුනාගැනීමේ අංකයක් ලබා ගැනීමට යටත් සෑම ආනයනකරුවකුටම, කොමසාරිස් ජනරාල්වරයා වෙත, නිශ්චිත ආකෘතියෙහි ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීම.

**12.** 3 වන වගන්තියේ හෝ 10 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, භාණ්ඩ හෝ සේවා සපයන සහ බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන හෝ කරනු ලබන හෝ ආනයන කටයුතු කරගෙන යන හෝ කරන යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා, කොමසාරිස් ජනරාල්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයෙහි ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ හැකි ය :

එසේ වුවද, කොමසාරිස් ජනරාල්වරයා විසින් කරුණු කියා සිටීමට එවැනි තැනැත්තකුට අවස්ථාව දීමෙන් පසු, ඒ තැනැත්තකු කරගෙන යන හෝ කරන ව්‍යාපාරයේ ස්වභාවය සහ බදු අයකිරීමේ පූර්ව කාලසීමා දෙකෙහි ඒ තැනැත්තා විසින් කරන ලද බදු අයකළ හැකි සැපයීම්වල වටිනාකම සලකා බලන විට, ඔහුගේ බදු අයකළ හැකි සැපයුම්වල වටිනාකම 10 වන වගන්තියේ සඳහන් වටිනාකම නොඉක්මවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ තැනැත්තා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු ඉල්ලා සිටිය හැකි බව.

**13.** 14 වන වගන්තිය යටතේ තැනැත්තකු ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් කරගෙන යන හෝ කරන යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට අදාළව තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා විසින් කවර හෝ අවස්ථාවක ඉල්ලා සිටිය හැකි ය.

ලියාපදිංචි තැනැත්තා.

**14.** (1) යම් තැනැත්තකු –

(අ) 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා, ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ අවස්ථාවක ;

(ආ) 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කරනු ලැබ ඒ ඉල්ලුම්පත කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ නොමැති අවස්ථාවක ;

(ඇ) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නැති නමුත් ඔහු විසින් කරගෙන යන හෝ කරන ගනුදෙනුවල ස්වභාවය සලකා බලන විට, ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, කරුණු කියා සිටීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට ලබා දීමෙන් පසු,

ඒ තැනැත්තා, කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට බලපැවැත්වෙන පරිදි ලියා පදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ සිටින හෝ 77 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන හෝ 2002 අගෝස්තු 1 වන දිනයේ දී 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 75 වන වගන්තිය යටතේ ලියාපදිංචි ලෙස සැලකෙන තැනැත්තකු බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන හෝ කරනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස සැලකිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය.

**15.** (1) 14 වන වගන්තිය යටතේ තැනැත්තකු ලියාපදිංචි කිරීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(අ) බදු ලියාපදිංචි කිරීමේ අංකයක් ; සහ

(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයක්,

ඒ තැනැත්තාට නිකුත් කළ යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි, ලියාපදිංචි තැනැත්තාගේ නම සහ අනෙකුත් අදාළ විස්තර ද ලියාපදිංචිය බලාත්මක වන දිනය ද ඒ තැනැත්තාගේ බදු ලියාපදිංචි අංකය ද දක්වා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ඒ සහතිකය, බදු අය කළ හැකි ක්‍රියාකාරකම ඔහු විසින් කරගෙන යන්නා වූ හෝ කරනු ලබන්නා වූ ස්ථානයේ ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය කළ යුතු ය. ව්‍යාපාර ස්ථාන එකකට වඩා ඇති අවස්ථාවක, ඒ සහතිකයේ පිටපත් ප්‍රදර්ශනය කළ හැකි ය.

(4) පළමුවන උපලේඛනයේ දැක්වෙන නිදහස් කරනු ලැබූ සැපයුමක් කරන සෑම ලියාපදිංචි තැනැත්තකුම පළමුවන උපලේඛනයේ දැක්වෙන පරිදි ඔහු විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවා ගණ කවරේ ද යන වග ඒ සැපයුම කරන එක් එක් ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(5) යම් තැනැත්තකු (3) වන හෝ (4) වන උපවගන්තිවල විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පණස් දහසකට නොවැඩි දණ්ඩන මුදලක් ඒ තැනැත්තාට පැනවිය හැකි අතර, ඒ දණ්ඩනය පැනවීම ගැන ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් දැනුම් දීමක් කරනු ලැබිය හැකි ය ;

(ආ) ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කාලසීමාව තුළ-

(i) ඒ දණ්ඩන මුදල ගෙවන ලෙස ; සහ

(ii) අවස්ථාවෝචිත පරිදි (3) වන හෝ (4) වන උපවගන්ති යටතේ වූ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කරන ලෙස,

ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(6) යම් තැනැත්තකු (3) වන හෝ (4) වන උපවගන්තිවල විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනය ඉක්ම වූ අවස්ථාගත කරුණු නිසා බවත්, පසුව එම නියමයන්ට අනුකූලව ඔහු ක්‍රියා කර ඇති බවත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා ඔප්පු කළහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩන මුදල අඩු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය අවලංගු කිරීම.

**16.** (1) මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමේ දිනයෙන් මාස දොළහක් ගතවූ පසු ලියාපදිංචි තැනැත්තකු බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීම හෝ කරගෙන යාම නතර කර ඇති හෙයින් හෝ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ඔහුගේ බදු අය කළ හැකි සැපයුම්වල මුළු වටිනාකම 10 වන වගන්තියේ දක්වා ඇති වටිනාකම නොඉක්මවන අවස්ථාවක, එකී මාස දොළහක කාලය ඉකුත් වූ පසු කවර හෝ වේලාවක ඔහුගේ ලියාපදිංචිය අවලංගු කරවා ගැනීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

(2) බදු අය කරනු ලැබිය හැකි ක්‍රියාකාරකමක් කරගෙන යාම හෝ කිරීම අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ ලියාපදිංචිකරු හෝ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු හෝ විසින් නවතා දමා ඇති බවට හෝ ඔහුගේ බදු අය කළ හැකි මුළු සැපයුම 10 වන වගන්තියේ දක්වා තිබෙන වටිනාකම නොඉක්මවන බවට හෝ රේගු ආඥාපනත යටතේ වූ පහසුකම්, ඔහු සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවා තිබෙන බවට නැතහොත් ඒ ලියාපදිංචි කිරීම අඛණ්ඩව පැවතීම ආදායමේ ආරක්ෂාවට බාධාවක් විය හැකි බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විටක -

(අ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, ඒ ඉල්ලුම්කරුගේ ලියාපදිංචිය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය ;

(ආ) කවර හෝ වේලාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම, ඒ තැනැත්තා බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කිරීම හෝ කරගෙන යාම නතර වී නැති බව හෝ ආදායම ආරක්ෂා කර ගැනීම පිණිස ඔහුගේ ලියාපදිංචිය, දිගටම පවත්වාගෙන යාම අවශ්‍ය හා උචිත බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක ඔහු විසින් ඒ තැනැත්තාගේ ලියාපදිංචිය අවලංගු කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) ලියාපදිංචි තැනැත්තකුගේ ලියාපදිංචිය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ අවලංගු කිරීමේ දිනය, ලියාපදිංචි තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

(5) ලියාපදිංචිය අවලංගු කරන විට ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලැබූ බදු අය කළ හැකි ක්‍රියාකාරකමක වත්කම්වල කොටසක් සංයුක්ත වන යම් භාණ්ඩ හෝ සේවා, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම (එම සියලු වත්කම් ද ඇතුළුව) ලියාපදිංචි තැනැත්තකු වන වෙනත් යම් තැනැත්තකු විසින් කරන්නේ නම් හෝ කරගෙන යන්නේ නම් මිස, අවලංගු කිරීමේ දිනට පෙරාතුව ම යම් වේලාවක බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීමේ දී හෝ කරගෙන යාමේ දී ඒ තැනැත්තා විසින් සපයනු ලැබූ ඒවා ලෙස, ලියාපදිංචිය අවලංගු කිරීමේ දිනයේ සිට බලාත්මක වන පරිදි සලකනු ලැබිය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කළ විට ලියාපදිංචි තැනැත්තා විසින් සහතිකය ආපසු දිය යුතු බව.

17. (1) යම් තැනැත්තකුගේ ලියාපදිංචිය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා –

(අ) ලියාපදිංචිය වලංගුව තිබූ අන්තිම බදු අය කළ හැකි කාලසීමාවේ අවසාන දිනයෙන් පසු දින දාහතරකට වඩා පමා නොවී, ඔහුට නිකුත් කරනු ලැබ තිබූ ලියාපදිංචි කිරීමේ සහතිකය කොමසාරිස් ජනරාල්වරයාට ආපසු දිය යුතු ය ;

(ආ) ඒ බදු අය කළ හැකි කටයුත්ත කරන හෝ කරගෙන යන කවර හෝ ස්ථානයක, ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එහි පිටපතක් ප්‍රදර්ශනය නොකළ යුතු ය ;

(ඇ) අවස්ථාවෝචිත පරිදි යම් බදු ඉන්වොයිස් පත්‍රයක්, බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් නිකුත් නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(අ) රුපියල් පණස් දහසකට නොවැඩි දණ්ඩන මුදලක් එම තැනැත්තාට පැනවිය හැකි අතර, එම දණ්ඩන මුදල පැනවීම පිළිබඳව එම තැනැත්තාට ලිඛිතව දැනුම් දිය හැකි ය ;

(ආ) ලිඛිත දැන්වීමක් මගින් –

(i) එම දණ්ඩන මුදල ගෙවන ලෙස ; සහ

(ii) එම දැන්වීමේ නිශ්චිතව දන්වනු ලැබිය හැකි කාලසීමාව තුළ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට

එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනයෙන් තොර අවස්ථානුගත කරුණු නියා බවත් පසුව එම විධිවිධානවලට අනුකූලව ඔහු ක්‍රියා කර ඇති බවත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි එම තැනැත්තා ඔප්පු කරන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ එම තැනැත්තා වෙත පනවන ලද දණ්ඩන මුදල අඩු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය අවලංගු කිරීම වගකීමට බලපෑමක් නොවන බව.

18. 16 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබුව ද, ලියාපදිංචි තැනැත්තකු, ඔහු ලියාපදිංචි තැනැත්තකුව සිටි කාලයේ දී ඔහු විසින් මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ කරන ලද බදු අය කළ හැකි සැපයුම් සම්බන්ධයෙන්, කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවකට වගකිව යුතු ය.

ඇතැම් වෙනස්වීම් ලියාපදිංචි තැනැත්තා විසින් දැනුම් දිය යුතු බව.

19. සෑම ලියාපදිංචි තැනැත්තකු ම –

(අ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකමක නාමෙහි, ලිපිනයෙහි හෝ කරගෙන යන ස්ථානයෙහි යම් වෙනසක් ;

(ආ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකමක ස්වභාවයේ යම් වෙනසක් ;

(ඇ) වාර්තා සහ වෙනත් ලේඛන අත්සන් කිරීමට බලයලත් තැනැත්තාගේ යම් වෙනසක් ;

(ඈ) බදු අය කළ හැකි ක්‍රියාකාරකමේ අයිතියේ යම් වෙනසක්,

ඒ වෙනස සිදු වීමෙන් දින දාහතරකට වැඩි කාලයක් පමා නොවී කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

බදු ඉන්වොයිස් පත්‍රය.

20. (1) බදු අය කළ හැකි සැපයුමක් කරන ලියාපදිංචි තැනැත්තකු විසින්, ඒ සැපයුම කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ ප්‍රතිග්‍රාහක තැනැත්තා ඒ සැපයුමේ වේලාවේ සිට දින දාහතරක් ඇතුළත ලිඛිත ඉල්ලීමක් කර ඔහු මේ පනත යටතේ ලියාපදිංචිවී ඇතිබව හෝ ඔහු මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස සලකනු ලබනු බව සඳහන්කර බදු ඉන්වොයිසි පත්‍රයක් නිකුත් කරන ලෙස ඉල්ලීමක් කර ඇත්නම් එම සැපයුමෙන් දින සිට දින විසි අටකට නොවැඩි කාලයක් තුළදී බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කළ යුතු ය :

එසේ වුවද, මේ පනත යටතේ ලියාපදිංචි හෝ ලියාපදිංචි ලෙස සැලකෙන තැනැත්තකු පලමු සැපයුම ලැබීමෙන් පසුව ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම් එම තැනැත්තා විසින් ඉන්පසුව කරන සැපයුම් සම්බන්ධයෙන් තවදුරටත් ඉල්ලීම් කිරීමට අවශ්‍ය නොවනු ඇත.

(2) බදු ඉන්වොයිස් පත්‍රයේ -

(අ) සැපයුම්කරුගේ නම, ලිපිනය සහ ලියාපදිංචි කිරීමේ අංකය ;

(ආ) සැපයුම කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ;

(ඇ) බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ දිනය සහ එහි අනුක්‍රමික අංකය ;

(ඈ) සැපයුම කළ දිනය සහ සපයන ලද භාණ්ඩ හෝ සේවාවල විස්තරය ;

(ඉ) සැපයුමේ ප්‍රමාණය හෝ ධාරිතාව ;

(ඊ) සැපයුමේ වටිනාකම, අය කළ බද්ද සහ සැපයුම සඳහා ප්‍රතිෂ්ඨාව ;

(උ) "බදු ඉන්වොයිසිය" යන වචන එම ඉන්වොයිස් පත්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක,

දක්වා තිබිය යුතු ය.

1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා පනත යටතේ 2002 අගෝස්තු 1 වන දිනට පෙර නිකුත් කරන ලද බදු ඉන්වොයිස් පත්‍රයක් මේ පනත යටතේ නිකුත් කරන ලද බදු ඉන්වොයිස් පත්‍රයක් ලෙස සැලකිය යුතු ය.

(3) භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක, රේගු භාණ්ඩ ප්‍රකාශනය හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සත්‍යායනය කරන ලද වෙනත් ලේඛනයක් බදු ඉන්වොයිස් පත්‍රය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා පනත යටතේ, මේ පනතේ 2002 අගෝස්තු 1 වන දිනට පෙර නිකුත් කරන ලද යම් රේගු භාණ්ඩ ප්‍රකාශනයක් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සත්‍යායනය කරන ලද යම් ලේඛනයක් ද බදු ඉන්වොයිස් පත්‍රයක් ලෙස සැලකිය හැක.

(4) සැපයුම ලබන්නාට බදු ඉන්වොයිස් පත්‍රයේ මුල් පිටපත නිකුත් කළ යුතු අතර එහි දෙවන පිටපත, එම බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කළ බදු අය කළ හැකි කාලසීමාව අවසන් වීමෙන් අවුරුදු පහක් ගතවන තෙක් ඒ සැපයුම කරනු ලබන්නා විසින් තබා ගත යුතු ය.

(5) එක් සැපයුමක් සඳහා බදු ඉන්වොයිස් පත්‍ර එකකට වඩා නිකුත් කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය. බදු ඉන්වොයිස් පත්‍රයෙහි මුල් පිටපත නැති වූ බව ලියාපදිංචි තැනැත්තා කියා සිටින්නේ නම්, "පිටපතක් පමණයි" යන්න පැහැදිලිව ලකුණු කරන ලද පිටපතක් එම ලියාපදිංචි තැනැත්තා වෙත සැපයුම්කරු විසින් නිකුත් කළ හැකි ය.

(6) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද ලියාපදිංචි තැනැත්තකු බදු අය කළ හැකි සැපයුමක් සිදු කරන විට ඒ සැපයුම ලබන තැනැත්තා ලියාපදිංචි තැනැත්තකු නොවේ නම්, ඒ සැපයුම් කරන තැනැත්තා ඒ සැපයුම සම්බන්ධව අය කළ බදු ද ඇතුළුව සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව සඳහන් කරමින් ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කළ යුතු ය. සැපයුම කරන තැනැත්තා එවැනි ඉන්වොයිස් පත්‍ර මගින් ආවරණය වන සැපයුම් සම්බන්ධ ප්‍රමාණවත් වාර්තා තබා නැති අවස්ථාවක, ඒ සියලු සැපයුම් පිළිගත් බදු අනුප්‍රමාණ යටතේ කරන ලද සැපයුම් ලෙස සැලකිය

යුතු ය. මේ උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ඉන්වොයිස් පත්‍රයක් මේ පනතේ කාර්ය සඳහා නිකුත් කරන ලද බදු ඉන්වොයිස් පත්‍රයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් විසිපන් දහසකට නො අඩු සහ රුපියල් දෙලක්ෂ පණස් දහසක් නො ඉක්මවන දඩයකට සහ ඉන් පසුව වරද දිගට ම සිදු කරන්නේ නම් ඒ වරද දිගට ම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් පන්සියය බැගින් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු වූ යම් තැනැත්තකු, එසේ වරදකරු වූ දින සිට දින දාහතරකට පසු දිගට ම වරද සිදු කරන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින් ව්‍යාපාරය වැසීම සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් එම ව්‍යාපාරය වැසීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වැසීම සඳහා වන ආඥාවකට එකඟව ක්‍රියා කිරීමට එම තැනැත්තා අපොහොසත් වන්නේ නම්, ඒ ආඥාව නිකුත් කිරීමේ දින සිට දින තුනකට නො අඩු සහ දින හතකට නො වැඩි දිනයක් නිශ්චිතව දන්වමින් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයා වෙත ආඥාවක් නිකුත් කරමින් එම දිනයට පෙර එම ව්‍යාපාරය වසා දමන ලෙස එම පිස්කල්වරයාට නියම කොට බලය පවරනු ලැබිය යුතු ය. එකී පිස්කල්වරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද යම් පොලිස් නිලධරයකුට සහ එකී පිස්කල්වරයා හෝ පොලිස් නිලධරයා විසින් අවශ්‍ය යයි සලකන වෙනත් සහායකයන් ද සමග එකී ව්‍යාපාරය කරගෙන යනු ලබන හෝ කරනු ලබන පරිශ්‍රයට ඇතුළු වී එම ව්‍යාපාරය වසා දැමීම සඳහා එම ආඥාව ප්‍රමාණවත් අධිකාර පත්‍රයක් වන්නේ ය.

## III වන පරිච්ඡේදය

### වාර්තා හා බදු ගණන් බැලීම

වාර්තා හා තොරතුරු සැපයිය යුතු බව.

**21.** (1) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම, එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසු එළඹෙන මාසයේ අවසාන දිනට වඩා පසු නොවී, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයීම පිළිබඳ වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයාට සැපයිය යුතු ය. ඒ සෑම වාර්තාවක් ම නිශ්චිත ආකෘතියේ විය යුතු අතර, ඒ ආකෘතියේ දැක්වීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් විය යුතු ය :

එසේ වුව ද මාස තුනක් වූ බදු අය කළ හැකි කාලසීමාවක් වෙන් කර දෙනු ලැබ සිටින යම් තැනැත්තකු විසින්, 2002 අගෝස්තු මස 1 වන දිනෙන් ආරම්භ වන මාස දෙකක කාලසීමාව වෙනුවෙන් වාර්තාවක් 2002 ඔක්තෝබර් මස අවසාන දිනට පසු නොවන දිනයක දී සපයනු ලැබිය යුතු ය.

(2) තක්සේරුකරුවකු විසින්, ලිඛිත දැන්වීමක් මගින්, ඔහුගේ මතය අනුව බදු අය කරනු ලැබිය හැකි එහෙත් ලියාපදිංචි තැනැත්තකු නොවන තැනැත්තකුට, ඒ දැන්වීමේ නියමිත කාලයක් ඇතුළත, නියමිත ආකෘති පත්‍රය මත වාර්තාවක් සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(3) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 21 වන වගන්තියේ (1) හෝ (3) වන උපවගන්ති යටතේ, 2002 අගෝස්තු මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන බදු අය කළ හැකි කාලසීමාවක් වෙනුවෙන් ලැබිය යුතු යම් වාර්තාවක්, මේ පනත යටතේ ලැබිය යුතු වාර්තාවක් ලෙස සැලකිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්යය සඳහා තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමකින් –

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එවැනි යම් අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් සකස් කළ ආකෘතියක හෝ ඒවායේ සංයෝජනයක අන්තර්ගත වූ ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවිලි තුණ්ඩු, ගිණුම්, විගණක වාර්තා හෝ ඔහු සන්තකයෙහි ඇති නිශ්චිතව සඳහන්

කරනු ලැබිය හැකි වෙනත් යම් ලේඛන, ඒ පොත්වල, ලේඛනවල සහ ගිණුම්වල ඇති සටහන් සැබෑදැයි පරීක්ෂා කර බැලීම සඳහා පරීක්ෂණයකට ඉදිරිපත් කිරීමට හෝ තක්සේරුකරු වෙත එවීමට ;

(ආ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට, යම් දිනයක හා යම් වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයකු මගින් පැමිණීමට,

නියම කරනු ලැබිය හැකි ය.

(5) මේ පනතේ කාර්ය සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමකින් –

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත යම් පොත්පත්, අතින් ලියූ, යන්ත්‍රානුසාරයෙන් හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් සකස් කළ ආකෘතියක හෝ ඒවායේ සංයෝජනයක අන්තර්ගත වූ ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ ඔහු සන්තකයෙහි ඇති ඒ දැන්වීමේ නිශ්චිතව ඇති වෙනත් ලේඛන ඉදිරිපත් කිරීමට හෝ ඒ නියෝජ්‍ය කොමසාරිස් වෙත එවීමට ;

(ආ) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් කරුණක් පිළිබඳව ඔහු පරීක්ෂා කරනු ලැබීම සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට යම් දිනයක හා යම් වේලාවක තමා ම හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පැමිණීමට,

නියම කරනු ලැබිය හැකි ය.

(6) 5 වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමකට අනුකූලව පැමිණෙන යම් තැනැත්තකුට එසේ පැමිණීමෙහි ලා අවශ්‍යයෙන්ම දරන්නට සිදු වූ යම් සාධාරණ වියදමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය.

(7) නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ අනුමතය ඇතිව තක්සේරුකරුවකු විසින් හෝ තමා සන්තකයෙහි ඇති, අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් ආකෘතියක හෝ ඒවායේ යම්

සංයෝජනයක වූ යම් ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, බැරපත්, ගිණුම්, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන නිශ්චිතව සඳහන් පරිදි, පොත්වල, ලේඛනවල සහ ගිණුම්වල සටහන් සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය තරම් කාලයක් මෙම පනතේ කාර්ය සඳහා තම භාරයෙහි රඳවා ගත හැකි ය.

(8) තක්සේරුකරුවකු විසින්, අවශ්‍ය යැයි අදහස් කරනු ලබන අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත, තක්සේරුකරුගේ මතය අනුව යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද සඳහා අවශ්‍ය හෝ අදාළ යම් කාරණයක් පිළිබඳව –

(අ) සම්පූර්ණ හෝ වැඩිදුර වාර්තා ; හෝ

(ආ) සම්පූර්ණ හෝ වැඩිදුර තොරතුරු,

සපයන ලෙසට ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය හැකි ය.

(9) යම් තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ පනත යටතේ සපයන ලදැයි අදහස් කෙරෙන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සැපයූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ වාර්තාවට, ප්‍රකාශයට හෝ ආකෘතියට අත්සන් කරන යම් තැනැත්තකු එහි සඳහන් සියලු කරුණු ගැන දැන සිටි බව සලකනු ලැබිය යුතු ය.

(10) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත වාර්තාවක් සපයන ලෙස ඔහුට විධාන කරමින් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුකරුවකු විසින් දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් –

(අ) රුපියල් පණස් දහසකට නොවැඩි මුදලක දණ්ඩනයක් ඒ තැනැත්තා වෙත පැනවිය හැකි අතර ඒ දණ්ඩනය පැනවීම ගැන ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමක් දිය හැකි ය ;

(ආ) පහත දැක්වෙන දේ කරන ලෙස ඒ තැනැත්තාට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ හැකි ය :—

(i) ඒ දණ්ඩන ගෙවීම ; සහ

(ii) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව සපයා නැත්නම් එය සැපයීම හෝ (2) වන උපවගන්තිය යටතේ ඔහුට දෙන ලද දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කර නැත්නම් ඒවාට අනුකූලව ක්‍රියා කිරීම.

(11) අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ විධිවිධාන වලට හෝ (2) වන උපවගන්තිය යටතේ විධිවිධානයට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වූයේ තමාගේ පාලනයෙන් බැහැර වූ හේතු නිසා බවත් ඊට පසුව ඔහු විසින් ඒ නියමයන්ට හෝ විධානයට අනුකූලව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා ඔප්පු කළහොත් (10) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් තැනැත්තකුට පනවන ලද යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කිරීම, හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(12) (9) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පනවන ලද අවස්ථාවක, හැර (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**22.** (1) ලියාපදිංචි තැනැත්තකු තමා විසින් කරන ලද බදු අය කළ හැකි සැපයුමක් සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව සඳහන් ආකාරයකින් සහ එසේ සඳහන් කරනු ලබන කාලයක දී එසේ සඳහන් කරනු ලබන බදු අය කළ හැකි කාල සීමාවන්ට යොමු කොට හිඟනුම් පෙන්වීම සහ බදු ගෙවීම කළ යුතු ය : යෙදවුම් බද්ද නිමැවුම් බද්දට බැරවාසියක් වශයෙන් ඉඩ දෙනු ලැබිය යුතු බව.

එසේ වුව ද 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා යම් ඇහලුම් නිෂ්පාදකයකු සමඟ එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා අවසර දී ඇති ඇහලුම් ප්‍රතිශතය ඇතුළත යම් ඇහලුම් සැපයීම මත අයවිය යුතු බදු මුදල ශ්‍රී ලංකාව ඇතුළත සපයනු ලබන එවැනි එක් එක් ඇහලුමක් සඳහා රුපියල් විසිපහක් විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ එක් එක් කාලසීමාව අවසානයේ දී මේ පනත යටතේ ඉඩ දෙනු ලැබිය හැකි තමාගේ යෙදවුම් බද්දේ ප්‍රමාණයක් සඳහා බැර වාසියකට හිමි විය යුතු මුදල තමාගෙන් අයවිය යුතු යම් නිමැවුම් බද්දකින් අඩු කිරීමට ද ලියාපදිංචි තැනැත්තකුට හිමිකම ලැබිය යුතු ය :

එසේ වුවද ගෙවීම් පදනම් කර ගත් ගිණුම්ගත කිරීමක් අනුගමනය කරන තැනැත්තකුට මේ පනත යටතේ ඉඩ දෙනු ලැබිය හැකි ප්‍රමාණයට තමාගේ යෙදවුම් බද්ද මත තමාගේ බැර වාසියට හිමිකම් ලැබිය යුත්තේ ඒ තැනැත්තා විසින් බද්ද ගෙවා ඇති සැපයුමක් වෙනුවෙන් පමණක් විය යුතු ය.

(3) ලියාපදිංචි තැනැත්තකුට සපයන ලද භාණ්ඩ හෝ සේවා හෝ ඔහු විසින් ආනයනය කරන ලද භාණ්ඩ ඔහු විසින් කරගෙන යනු ලැබූ හෝ කරනු ලැබූ බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට භාවිත කරන සහ කොටසක් වෙනත් කාර්ය සඳහා භාවිත කරන අවස්ථාවක සැපයුම් සහ ආනයන කිරීම් මත වූ බද්ද ඒ සැපයුමෙන් හෝ ආනයනය කිරීමෙන් ඔහුගේ බදු පැනවිය හැකි බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට යොමු කළ හැකි ප්‍රමාණය පමණක් ඔහුගේ යෙදවුම් බද්ද වශයෙන් ගණන් ගැනෙන පරිදි වෙන් කර දිය යුතු ය :

එසේ වුවද, 2000 අංක 56 දරන, කල්බදු මූල්‍යකරණ පනත යටතේ කල්බදු පහසුකම් සපයන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට අවුරුදු තුනකට අඩු කාලයක් සඳහා කල් බදු ගිවිසුම යටතේ සපයන ලද භාණ්ඩ වෙනුවෙන් යෙදවුම් බද්ද, එවැනි භාණ්ඩ සඳහා අය කරන බද්ද සියයට දහයට වැඩි වුවත්, සියයට දහයක හෝ ඊට අඩු අනුප්‍රමාණයක් අනුව ගණනය කළ යුතු ය.

(4) 21 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ යම් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක සහ එම වාර්තාව අදාළ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසානයේ දී යෙදවුම් බද්දේ ප්‍රමාණය නිමැවුම් බද්දේ ප්‍රමාණය ඉක්මවන්නේ

නම් යෙදවුම් බද්දේ අතිරික්තය 58 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආපසු ගෙවනු ලැබිය යුතු අතර, එය එසේ ආපසු ගෙවා නොමැති අවස්ථාවක, එම ආපසු ගෙවීම කළ යුතු වූයේ යම් බදු අය කළ හැකි කාලසීමාවකදී ද, ඒ කාලසීමාව අවසානයේ සිට මාස දෙකක් ඉකුත්වන දිනයෙන් ආරම්භව, ආපසු ගෙවීම කරන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, ඒ මුදල මත, 59 වන වගන්තියෙන් නියමිත අනුප්‍රමාණ අනුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් පොලී ගෙවිය යුතු ය :

එසේ වුවද, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 අගෝස්තු 1 වන දින හෝ ඉන්පසුව ආපසු ගෙවිය යුතු අතිරික්ත යෙදවුම් බද්දක ශේෂයක් 2002 අගෝස්තු 01 වන දිනට ආපසු ගෙවීමට ඉතිරිව ඇති අවස්ථාවක, මේ පනත යටතේ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා අයවිය යුතු යම් නිමැවුම් බද්දකින් ඒ අතිරික්තය අඩුකර නොගත යුතු අතර, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ, ඒ අනුව, එය ආපසු ගෙවිය යුතු ය.

(5) ලියාපදිංචි නොමැති තැනැත්තකු විසින් ඔහුගේ ඉඩම හා ගොඩනැගිලි කුලී නිවැසි ගිවිසුමකට අනුව ලියාපදිංචි තැනැත්තකුට බද්දට දුනහොත්, ඒ ඉඩමේ හා ගොඩනැගිල්ලේ සපයනු ලබන සේවා සම්බන්ධයෙන් දරන ලද යම් වියදමක් වෙනුවෙන් කිසි යෙදවුම් බද්දකට හිමිකම් කියා සිටීමට ඒ ලියාපදිංචිය නොමැති තැනැත්තාට හිමිකමක් නොමැති වුව ද, කුලී නිවැසි ගිවිසුමක් ඒ ඉඩම හා ගොඩනැගිල්ල සම්බන්ධයෙන් පැවති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි තහවුරු කෙරෙන ප්‍රමාණවත් සාක්ෂි ඒ ලියාපදිංචි තැනැත්තා විසින් සපයනු ලැබුවහොත්, ඒ ලියාපදිංචි තැනැත්තා විසින් ඒ ඉඩමේ සපයන සේවා සම්බන්ධයෙන්, එම කුලී නිවැසි ගිවිසුමේ කාලසීමාව සඳහා යෙදවුම් බදු හිමිකම් කියා සිටීමට ඔහුට අයිතිය ඇත්තේ ය :

එසේ වුව ද–

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්ව සිටින ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් බදු අය කළ හැකි කාලසීමාවක යෙදවුම් බදු අතිරික්තයක් පවත්නා සහ ඒ බදු අය කළ හැකි කාලසීමාව 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ උපලේඛනයේ (xxvii) විෂයයේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ (xx) විෂයයේ සඳහන් කාලසීමාව ඇතුළත හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ (xxvii) විෂයයේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ විෂයයේ (xx) හෝ සඳහන් ගිවිසුමක නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ

කාලසීමාව ඇතුළත හෝ වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ වීම දක්වා යන මෙයින් කලින් එළඹෙන කාලසීමාව ඇතුළත යෙදෙන අවස්ථාවක ඒ අතිරික්තය ; හෝ

(ආ) (6) වන උපවගන්තියේ සඳහන් වන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට යෙදවුම් බද්දේ අතිරික්තයක් පවත්නා සහ ඒ බදු අයකළ හැකි කාලසීමාව ඒ තැනැත්තා විසින් භාරගන්නා ලද පරිදි බදු අය කළ හැකි සැපයුම් කිරීම ආරම්භ වූ බදු අය කළ හැකි කාලසීමාවට කලින් යෙදෙන අවස්ථාවක ඒ අතිරික්තය ;

(ඇ) යම් බදු අය කළ හැකි කාලසීමාවක, 2 වන වගන්තිය යටතේ අවලම්භනය කරන ලද බද්ද ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තයක් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම්වල වටිනාකම ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා හෝ බදු අය කළ හැකි මුළු සැපයුම් ප්‍රමාණයෙන් සියයට පණහකට වැඩි අවස්ථාවක පූර්ව බදු අය කළ හැකි කාලසීමාවකින් ඉදිරියට ගෙන ආ යම් අතිරික්තයක් ද ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තය ; හෝ

(ඈ) යම් බදු අය කළ හැකි කාලසීමාවක් තුළ 2 වන වගන්තිය යටතේ බදු අවලම්භනය කිරීමක් ලබාගත් යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා යම් ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම් කර නැති හෝ මුළු බදු අය කළ හැකි සැපයුම්වලින් සියයට පණහක හෝ ඊට අඩු ශුන්‍ය අනුප්‍රමාණගත සැපයුම් කර ඇති අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ වූ ඒ අවලම්භනය කළ බද්දේ ප්‍රමාණය ඉක්ම නොයන්නා වූ යෙදවුම් බද්දේ අතිරික්තය,

අවස්ථාවෝචිත පරිදි එකී අතිරික්තයේ කොටස හෝ අතිරික්තය මේ පනත යටතේ බදු අයකළ හැකි කාලසීමාව ඉදිරියට ගෙන ආ අතිරික්තයක් හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 ජූලි 31 වන දින හෝ ඊට පෙර අවසන්වන යම් බදු අයකළ හැකි කාලසීමාවකින් ඉදිරියට ගෙන ආ යම් අතිරික්තයක් ද ඇතුළුව, 58 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ දී හෝ අතිරික්තය පැන නැඟුනා වූ බදු අය කළ හැකි කාලසීමාව සඳහා වූ වාර්තාව ලැබුණු දින යන දින දෙකින් පසුව එළඹුණු දින සිට මාස එකක් පසු නොකර ආපසු ගෙවිය යුතු ය :

එසේම තවදුරටත්, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ගෙවන ලද බද්ද නියෝජනය කරමින් අතිරික්ත යෙදවුම් බද්ද පිරිසැකසුම් නොකර නැවත විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරන්නා වූ ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට ආපසු නොගෙවිය යුතු ය.

ඒ කාලසීමාව ඇතුළත ඒ ආපසු ගෙවීම කිරීමට නොහැකි වන අවස්ථාවක දී ආපසු ගෙවීම කළ යුතුව තිබුණු දිනයේ සිට ඒ ගෙවීම කරන ලද දිනය තෙක් වූ කාලය සඳහා 59 වන වගන්තිය යටතේ නියම කරනු ලැබ ඇති අනුප්‍රමාණය අනුව, ඒ වගන්තියේ අතුරු විධානයේ විධිවිධානවලට යටත්ව, ඒ ආපසු ගෙවිය යුතු මුදල මත පොලිය ගෙවනු ලැබිය යුතු ය.

(6) ලබාගත් භාණ්ඩ හෝ සේවාවලට ආරෝපණය කළ හැකි යම් යෙදවුම් බද්දක්, මෙහි පහත දැක්වෙන දේ වෙනුවෙන්, (2) වන උපවගන්තිය යටතේ අඩු නොකළ යුතු ය :-

(i) සැපයුම, මෝටර් සයිකල්, බයිසිකල්, සේවායෝජකයකු විසින් ඔහුගේ සේවානියුක්තයන් ප්‍රවාහනය සඳහා සපයා ඇති මෝටර් කෝච් රථ, සංචාරක ගමන් සඳහා භාවිත කරන මෝටර් වාහන හෝ සංචාරකයන් ප්‍රවාහනය සඳහා හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිත කරන මෝටර් වාහන හෝ කුලී මෝටර් රථ, හෝ නොවන වෙනත් මෝටර් වාහන සම්බන්ධයෙන් නම් හෝ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක වෙළෙඳ බඩු තොගයේ කොටසක් නොවන මෝටර් වාහනයක් නොවන මෝටර් වාහන සම්බන්ධයෙන් නම් ;

(ii) ලබාගත් භාණ්ඩ හෝ සේවා සැපයුම බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට සම්බන්ධ නැතිනම් ;

(iii) ලබාගත් භාණ්ඩ හෝ සේවා සැපයුම-

(අ) (i) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ හෝ මේ පනත යටතේ හෝ නියි පරිදි නිකුත් කරන ලද බදු ඉන්වොයිසියකින් සනාථ කර නැත්නම් ; සහ

(ii) යම් බදු අය කළ හැකි කාලසීමාවක් වෙනුවෙන් ද ඒ කාලසීමාව අවසානයේ සිට මාස දොළහක් ඇතුළත බදු ඉන්වොයිස් පත්‍රයක් ලබාගෙන නැත්නම් ; හෝ

(ආ) රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රේගු භාණ්ඩ ප්‍රකාශනයක් හෝ වෙනත් සහතික කළ ලේඛනයක් නිකුත් කර ඇත්නම් ;

(iv) ඒ ඉන්වොයිසිය මත (iii) වන අනුඡේදයේ සඳහන් පරිදි වූ යෙදවුම් බද්ද, ඒ ඉන්වොයිසිය ලැබුණු බදු අය කළ හැකි කාලසීමාවේ අවසන් දිනයේ සිට මාස හයක් ඉකුත් වීමට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක නිමැවුම් බද්දෙන් අඩු කර ගෙන නොමැති නම්,

එසේ වුවද, (3) වන උපවගන්තියේ සහ (5) වන උපවගන්තියේ (ii) වන අනුඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, (205 වන අධිකාරය) විදුලිබල පනත යටතේ බලපත්‍රයක් ලබා සිටින සහ විදුලිබලය බෙදා හැරීමෙහි නිරත වන යම් ලියාපදිංචි තැනැත්තකුට එසේ බෙදා හැරීම සඳහා විදුලිබලය මිල දී ගැනීම් වෙනුවෙන්, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ උපලේඛනයේ (xxvi) විෂයය යටතේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ (xviii) විෂයය යටතේ හෝ යෙදවුම් බදු සඳහා ඉඩ හැරිය හැකි ය.

(7) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, ඔහු ශ්‍රී ලංකාවෙහි යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා යම් ව්‍යාපාරයක් හෝ යම් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව සහ ඒ ආරම්භ කිරීමේ දින සිට මාස තිහක කාලයක් ඇතුළත දී ඒ ව්‍යාපාරය සම්බන්ධව බදු අය කළ හැකි සැපයුමක් කිරීමට භාරගන්නා බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට සනාථ කර ඇති අවස්ථාවක, 14 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින්, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, ඒ ව්‍යාපාරය හෝ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින්, (5) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව යෙදවුම් බද්ද සඳහා බැර වාසි දීමට ඉඩ දෙනු ලැබිය හැකි ය. තව ද ව්‍යාපෘතියේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී මාස තිහක කාලය, බදු අය කළ හැකි සැපයුම් කිරීමට ප්‍රමාණවත්

නොවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ ලියාපදිංචි තැනැත්තා විසින් ඒ බවට කරන ඉල්ලීමක පදනම මත, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(8) 33 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද නියමිත මුදලට අතිරික්ත යම් ආපසු ගෙවීමක් හෝ මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ හෝ ඉල්ලා සිටින යෙදවුම් බද්දේ යම් අතිරික්ත මුදලක් ආපසු ගෙවීම කරන ලද්දේ හෝ ඒ ඉල්ලීම කරන ලද්දේ යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාට අදාළව තක්සේරුකරුවකු විසින් තක්සේරුවක් කරනු ලැබිය යුතු අතර, ඒ මුදල, අවස්ථාවෝචිත පරිදි, ඒ ආපසු ගෙවීම සිදු වූ හෝ යෙදවුම් බද්දේ අතිරික්තය ඇති වූ බදු අය කළ හැකි කාලසීමාවේ පළමුවන දිනයට පැවති පැහැර හැරි බද්ද ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා, යම් වාර්තාවක් මගින්-

(අ) අවස්ථාවෝචිත පරිදි 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ උපලේඛනයේ (xxvii) විෂයයේ හෝ (xxviii) විෂයයේ හෝ නැතහොත් මේ පනතේ පළමුවන උපලේඛනයේ (xix) විෂයය හෝ (xx) විෂයයේ සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව ඇතුළත හෝ එම කාලසීමාව සම්පූර්ණ වීමේ දී වාණිජ මෙහෙයුම් ආරම්භ කර නොමැති යම් තැනැත්තකු විසින් ;

(ආ) (6) වන උපවගන්තිය යටතේ අනුමතිය ලබාගෙන තිබෙන එහෙත් ඒ අනුමතිය ලබා ගැනීමට පූර්වයෙන් ඒ තැනැත්තා විසින් දෙන ලද පොරොන්දුවේ ප්‍රකාශිත පරිදි, බදු අය කළ හැකි සැපයුම් කිරීමේ ව්‍යාපාරය ආරම්භ කර නොමැති යම් තැනැත්තකු විසින්

හිමිකම් කියා සිටින යම් යෙදවුම් බද්දක්, ඒ තැනැත්තා හිමිකම් කියා සිටින අතිරික්ත යෙදවුම් බදු මුදලක් ලෙස සැලකිය යුතු ය.

**23.** සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම ඉන්වොයිස් පදනම මත බදු සඳහා ගිණුම් දැක්විය යුතු ය : ගිණුම් පදනම.

එසේ වුව ද, ලියාපදිංචි තැනැත්තකු විසින් ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් අනුව නියම කරනු ලැබිය හැකි කොන්දේසි මත ගෙවීමේ පදනමක් මත බදු සඳහා ගිණුම් දැක්වීම කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට විධාන කළ හැකි ය.

බොල් ණය.

**24.** යම් බදු අය කළ හැකි කාලසීමාවක ගෙවිය යුතු බද්දේ ප්‍රමාණය නිශ්චය කිරීමේ දී, ලියාපදිංචි තැනැත්තකුගේ බදු අය කළ හැකි ක්‍රියාකාරකමෙහි දී 1998 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ඇතිකර ගත්තා වූ ණයක් ඒ බදු අය කළ හැකි කාලසීමාව ඇතුළත බොල් බවට පත් වූ ද යම් බොල් ණයක් සම්බන්ධයෙන් ඊට අනුරූප බදු ප්‍රමාණයක් අඩු කළ යුතු ය. අඩු කළ හැකි බද්දේ ප්‍රමාණය කපා හැරීමට ඇති බොල් ණය සම්බන්ධයෙන් කලින් බදු අය කළ හැකි කාලසීමාවක දී බදු වශයෙන් ගෙවූ ප්‍රමාණය නොඉක්මවිය යුතු ය :

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර හෝ ඉන් පසුව එසේ කපා හරින ලද බොල් ණයක් වෙනුවෙන් යම් බදු අය කළ හැකි කාලසීමාවක දී ඒ තැනැත්තාට බොල් ණය වෙනුවෙන් යම් මුදලක් ලැබුණහොත් 33 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුනද, ලැබුණු මුදල එය ලැබුණු බදු අය කළ හැකි කාලසීමාවේ මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ ලැබුණු බදු අය කළ හැකි සැපයුමක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එය බද්දට යටත් විය යුතු ය :

තවදුරටත් එසේ වුව ද, යම් තැනැත්තකු විසින්, බොල් ණයකට අනුරූපී බද්දේ යම් ප්‍රමාණයක් අඩු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ බොල් ණය දරන ලද්දේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ලියාපදිංචි තැනැත්තකු නම්, ඒ තැනැත්තාගේ ඊට අනුරූපී කාලසීමාව සඳහා එසේ අඩුකර ගන්නා ලද මුදල් ප්‍රමාණය නිමැවුම් බද්දක් විය යුතු ය.

බැර හෝ හර නෝට්ටු මගින් බද්ද ගැලපීම.

**25.** (1) ලියාපදිංචි තැනැත්තකු බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කර වෙනත් තැනැත්තකුට කරන ලද සැපයුමක් මත බද්ද අඩුවෙන් අය කිරීමෙන් හෝ වැඩියෙන් අය කිරීමෙන් හෝ වැරදි බදු ප්‍රමාණයක් සඳහා ගිණුම් දක්වා ඇති අවස්ථාවක, එසේ අඩුවෙන් අය කරන ලද හෝ වැඩියෙන් අය කරන ලද බදු ප්‍රමාණය ගැලපීමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් ඒ අතික් තැනැත්තාට නිකුත් කිරීමට ඔහුට හිමිකම ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි බදු හර නෝට්ටුවක් හෝ බදු බැර නෝට්ටුවක් සැපයුමක් වෙනුවෙන් ඒ නෝට්ටුව නිකුත් කළ කාලසීමාවට අදාළව නිකුත් කළ විට–

(අ) ගිණුම් පෙන්වන ලද ගණනට වැඩියෙන් ඒ සැපයුම වෙනුවෙන් අය කළ හැකි බද්දේ ප්‍රමාණය සැපයුම්කරු විසින් නිමැවුම් බදු වශයෙන් ගෙවිය යුතු ය. එසේ නැතහොත් නිමැවුම් බදු වශයෙන් ගිණුම් පෙන්වන ලද අය කළ හැකි බද්දට වැඩියෙන් වූ නිමැවුම් බද්ද සැපයුම්කරු විසින් යෙදවුම් බද්ද වශයෙන් අඩු කළ යුතු ය ; සහ

(ආ) ලැබුම්කරු ලියාපදිංචි තැනැත්තකු වේ නම් ඒ ලැබුම්කරු විසින් යෙදවුම් බද්ද වශයෙන් අඩු කරගත් මුදල අඩු කළ යුතුව තිබූ නිසි මුදලට වැඩි වන ප්‍රමාණය නිමැවුම් බද්ද වශයෙන් ගෙවිය යුතු ය. එසේ නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, අඩු කළ යුතුව තිබූ මුදලේ ඔහු විසින් අඩු කර ගත් මුදලට වැඩි ප්‍රමාණය යෙදවුම් බද්ද වශයෙන් අඩු කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් බදු හර නෝට්ටු හෝ බදු බැර නෝට්ටුව නිශ්චිත ආකෘතියේ විය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### බදු ගෙවීම

**26.** (1) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද, ඒ බදු අය කළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු ය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් බද්දක් එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා මේ පනතේ කාර්යය සඳහා ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය. බදු ගෙවීම.

(2) 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේද යටතේ හෝ 31 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තක්සේරු කරන ලද බද්දක තක්සේරුවට විරුද්ධව අභියාචනය කර ඇති අවස්ථාවක–

(අ) කොමසාරිස් ජනරාල්වරයා වෙත විලම්භනය කිරීම සඳහා ලියවිල්ලකින් ඉල්ලීමක් කර ඇති අවස්ථාවක ;

(ආ) සැපයුවා යයි කියනු ලබන සැපයුම් සම්බන්ධයෙන් තක්සේරු කරන ලද නමුත් ගෙවිය යුතු බද්ද ඒ තැනැත්තා විසින් අයකළ හැකි බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කර ඇති අවස්ථාවක,

කොමසාරිස් ජනරාල්වරයා විසින් බද්ද නියමිත දිනට ගෙවීම විලම්භනය කළ හැක :

එසේ වුවද, අභියාචනය පිළිබඳ තීරණයක් කළ විට හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් එම විලම්භනය ඉවත් කරනු ලැබූ විට එම විලම්භනය කරනු ලැබූ බද්ද හෝ බද්දෙන් කොටස ගෙවිය යුතු වන අතර, එය ඒ බද්ද මුලදී අයවිය යුතුව තිබුණු දිනයේ සිට පැහැර හරින ලද බද්දක් ලෙස සැලකිය යුතු ය.

ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය.

**27.** (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන්–

(අ) ගෙවීම පැහැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) ගෙවීම පැහැර ඇති මුදල් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ අවසන් දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක ගෙවීම පැහැර හැර තිබෙන කාලසීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි අවසාන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්,

ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට සියයක් කවර අවස්ථාවක දී හෝ නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදු වී ඇති යම් විශේෂ කාරණ

හේතු කොට ගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැර දැමීම හෝ අඩු කිරීම කළ හැකි ය.

(2) VI වන පරිච්ඡේදය යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීම මත (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කරන ලද යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක ඒ මුදල හෝ මුදල් එසේ අඩු කරන ලද බද්ද මත ගණන් බැලිය යුතු ය.

## V වන පරිච්ඡේදය

## බදු තක්සේරු කිරීම

තක්සේරු කිරීමට තක්සේරුකරුට ඇති බලය.

28. (1) තක්සේරුකරුවකුගේ මතය අනුව-

(අ) යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා වාර්තාවක් සැපයීම පැහැර හරින අවස්ථාවක ; හෝ

(ආ) යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා වාර්තාවක් සපයන නමුත් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක ; හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සපයන ලද යම් වාර්තාවක යම් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින අවස්ථාවක,

තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවිය යුතුව තිබුණු බද්දේ ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තැනැත්තා ට ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ යුතු ය. යම් තැනැත්තකු සම්බන්ධයෙන් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එසේ තක්සේරු කරන ලද මුදල, ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවිය යුතු බදු මුදල වශයෙන් සැලකිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, මේ වගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් බදු අය කළ හැකි කාලසීමා එකක් හෝ වැඩි ගණනක් සඳහා විය හැකි ය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද තක්සේරුවකින් ඒ තක්සේරු කරන ලද මුදල් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඔහුගෙන් අයවිය යුතු බදු මුදල වූවාක් සේ සලකා 27 වන වගන්තිය යටතේ දණ්ඩනයකට ඒ තැනැත්තාගේ බැඳීම කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

(3) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වාර්තාවක් සැපයීමට අපොහොසත් වූ තැනැත්තකු විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවන ලද බදු මුදල තක්සේරුකරුගේ මතය අනුව, ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු නියම මුදලට වඩා අඩු වූ අවස්ථාවක, තක්සේරුකරුගේ විනිශ්චය අනුව ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(4) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනස ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ගෙවීම පැහැර හරින ලද බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුනේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

වාර්තාවක් පිළිනොගන්නේ මන්ද යන්න තක්සේරුකරු විසින් ප්‍රකාශ කළ යුතු බව.

**29.** යම් තැනැත්තකු විසින් 21 වන වගන්තිය යටතේ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සපයන ලද වාර්තාවක් තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ වන පරිදි අවස්ථාවෝචිත පරිදි 28 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ 31 වන වගන්තිය යටතේ අතිරේක තක්සේරුවක්

කරනු ලබන අවස්ථාවක තක්සේරුකරු විසින් එම වාර්තාව පිළිගනු නොලබන්නේ මන්ද යන වග තැපැල් මගින් යවන ලියාපදිංචි ලිපියකින් ඒ තැනැත්තාට දැනුම් දිය යුතු ය.

විවෘත වෙළෙඳපොළේ වටිනාකම තීරණය කිරීමට තක්සේරුකරුට ඇති බලය.

**30.** ලියාපදිංචි තැනැත්තකු විසින් බද්ද ගෙවීම මගහැරීම පිණිස–

(අ) සැපයුම්වල විවෘත වෙළෙඳපොළේ වටිනාකමට වඩා අඩු වටිනාකමට හෝ කිසිදු වටිනාකමක් නොමැතිව බදු අය කළ හැකි සැපයුමක් කර ඇති බව ; හෝ

(ආ) බදු අය කළ හැකි සැපයුම් ලැබීමට සම්බන්ධ ගනුදෙනුව ආශ්‍රිත තැනැත්තන් දෙදෙනකු අතර කර ඇති බව,

තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, බද්ද අයකරනු ලැබිය යුතු සැපයුමේ විවෘත වෙළෙඳපොළේ වටිනාකම ගනුදෙනුවේ අවස්ථානුගත කරුණු සහ සැපයුමේ කාලය සැලකිල්ලට ගෙන ඔහු විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

අතිරේක තක්සේරුව.

**31.** (1) බද්ද අය කළ හැක්කේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා විසින්, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා බද්ද වශයෙන් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඔහු විසින්, ගෙවිය යුතු හෝ ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා අයකර ගත හැකි නියම මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක තක්සේරුකරුගේ විනිශ්චයට අනුව ඒ තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතුව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකට ද ඒ අතිරේක මුදල් ප්‍රමාණය එකී තැනැත්තාගෙන් අයවිය යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකි ය. තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත තක්සේරු කිරීමේ දැන්වීමක් දෙනු ලැබිය යුතු ය.

(2) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා නොගෙවා පැහැර හරින ලද බද්ද ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් දිනයක ද එදින සිට ඒ තැනැත්තා ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

වාර්තා හා තක්සේරු පිළිබඳ සාක්ෂි.

**32.** මේ පනත යටතේ සපයන ලද හෝ කරන ලද යම් වාර්තාවක හෝ තක්සේරුවක පිටපතක් හෝ උධෘතයක් යනුවෙන් අදහස් කරමින් කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන යටතේ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම සියලු අධිකරණවල ආවේශ්‍ය විය යුතු අතර, එය මුල් ලේඛනය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

තක්සේරු කිරීම හෝ අතිරේක තක්සේරුව සඳහා වූ කාලය සීමා කිරීම.

**33.** (1) යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා යම් ලියාපදිංචි තැනැත්තකු විසින් 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන පරිදි වාර්තාවක් සපයා ඇති අවස්ථාවක, හෝ ඕනෑම කාල සීමාවක් සඳහා බදු තක්සේරු කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි තක්සේරුව කරනු ලැබුවේ හෝ වාර්තාව සපයනු ලැබුවේ හෝ තක්සේරුව කරනු ලැබුවේ යම් බදු අය කළ හැකි කාලසීමාවක් වෙනුවෙන් ද ඒ කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු තක්සේරුකරුවකු විසින් තක්සේරුවක්-

(අ) කරනු ලැබ නැති අවස්ථාවක තක්සේරුවක් කිරීම ; හෝ

(ආ) කරනු ලැබ ඇති අවස්ථාවක නම් අතිරේක තක්සේරුවක් කිරීම,

නීත්‍යානුකූල නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ගෙවිය යුතු බද්ද තීරණය කිරීම පිණිස අවශ්‍ය කරන්නා වූ සියලු වැදගත් වන කරුණු පිළිබඳව පූර්ණ හා සත්‍ය හෙළිදරව් කිරීමක් කිරීම යම් තැනැත්තකු විසින් සිතා මතා ම හෝ වංචනිකව පැහැර හැර ඇති බව තක්සේරුකරුගේ මතය වූ අවස්ථාවක තක්සේරුකරු විසින් තක්සේරුවක්-

(අ) කර නැති අවස්ථාවක, කවර හෝ වේලාවක තක්සේරුවක් කිරීම ; හෝ

(ආ) කර ඇති අවස්ථාවක, කවර හෝ වේලාවක අතිරේක තක්සේරුවක් කිරීම,

නීත්‍යානුකූල විය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### අභියාචන

කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන.

**34.** (1) මේ පනත යටතේ යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරුකරුවකු විසින් අවස්ථාවෝචිත පරිදි කරන ලද යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩනයක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තා අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව, අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම භාරදීමේ දිනයට පසු දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට විරුද්ධව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළ හැකි ය. අභියාචනය කරනු ලැබුව ද මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද බද්ද 26 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුරවීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා ඒ කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) සෑම අභියාචනයක් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව, වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද විටෙක වාර්තාවක් සහ ඒ වාර්තාව මත අයවිය යුතු බද්ද හා දණ්ඩන මුදල ගෙවූ බවට සාක්ෂි ද සමග අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් බදු අය කළ හැකි කාලසීමාවන් සඳහා වූ තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කරන සෑම තැනැත්තකු විසින් ම, (ඒ වන විටත් ඔහු විසින් එසේ කර ඇත්තේ නම් මිස) ඒ කාලසීමාව සඳහා ඔහු විසින් සපයා ඇති වාර්තාවේ පදනම මත ඔහු විසින් ගෙවිය යුතු බද්ද,

ඒ තක්සේරු දැන්වීමේ දිනය තෙක් ඒ මත එකතු වූ යම් දණ්ඩනයක් ද සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. තව ද ඒ ගෙවීම සනාථ කරනු පිණිස රිසිට්පතක් ඔහු විසින් අභියාචන පෙත්සමට අමුණා තිබිය යුතු ය :

එසේ වුව ද, ඒ තක්සේරු දැන්වීමේ කාලයේ දී හෝ ඊට ආසන්න කාලයේ දී අභියාචක විසින් විඳින ලද බලවත් මුදල් දුෂ්කරතා හේතුකොට ගෙන හෝ වෙනත් සාධාරණ හේතුවක් කරණ කොට ගෙන අභියාචක ඒ බද්ද හෝ දණ්ඩනය ගෙවීමෙන් වළක්වා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වීමෙන් පසු ඒ බද්ද සහ ගෙවීමේ දිනය තෙක් ඒ මත එකතු වූ දණ්ඩනය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් දෙනු ලැබිය හැකි ය. ඒ දීර්ඝ කරන ලද කාලය තුළ දී ඉදිරිපත් කරන ලද රිසිට් පත මේ උපවගන්තියේ කාර්ය සඳහා අභියාචන පෙත්සමට අමුණන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ නියමිත කාලසීමාව ඇතුළත ඉදිරිපත් කරනු නොලැබූ හෝ (2) වන, (3) වන හා (4) වන උපවගන්තිවලට අනුකූල නොවන සෑම අභියාචනයක් ම වලංගු නොවිය යුතු ය.

(6) වලංගු අභියාචන පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස් ජනරාල්වරයා විසින්, තක්සේරුකරුවකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේ දී එකඟ වීමකට එළඹුණහොත් තක්සේරුව අවශ්‍ය පරිදි ගලපා ගත යුතු ය.

(7) (6) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කළ යුතු ය.

(8) සෑම අභියාචකයකු ම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියෙහි පැමිණ සිටිය යුතු ය. පුද්ගලික හෝ බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන

විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචනයක විභාගය අඩාළව කල්තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා කල්පනා කරන්නේ නම්, තමා විසින් නියම කරනු ලැබූ වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය කලින් කල අඩාළව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාළව කල් තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, අඩාළව කල් තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණ සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ යම් අඩාළව කල් තැබූ විභාගයක් සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්තිසහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචනයේ විභාගයේ දී හෝ අඩාළව කල් තැබූ යම් අභියාචනයක විභාගයක දී ඔහු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබුයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුරභාවය හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කල හැකි ය :

තවදුරටත් එසේ වුව ද, මේ පරිච්ඡේදය යටතේ වූ සෑම අභියාචන පෙත්සමක් සම්බන්ධයෙන් ම ඒ අභියාචනය අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු විසින් හැර යම් තැනැත්තකු විසින් යම් ලේඛනයක් සැපයීම හෝ යම්

ක්‍රියා මාර්ගයක් ගැනීම මත රැඳී ඇත්තේ නම් මිස, ඒ අභියාචන පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුනේ යම් දිනයක ද ඒ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත ඒ ගැන එකඟත්වයට පැමිණීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කිරීම හෝ කරනු ලැබිය යුතු ය. ඒ කාලසීමාව තුළ දී ඒ අභියාචනය ගැන එකඟත්වයට නොපැමිණ හෝ තීරණය කරනු නොලැබූ අවස්ථාවක, ඒ අභියාචනයට ඉඩ දෙනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර, බද්ද ඒ අනුව අයකරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ වූ යම් අභියාචනයක් ලැබුණු බව දන්වා සිටිය යුතු අතර, එසේ ලැබුණු බව දන්වා යැවූ ලිපියේ දිනය, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය. මෙම අතුරු විධානයේ කාර්යය සඳහා, (4) වන උපවගන්තිය යටතේ බදු ගෙවීම සඳහා අභියාචකයකුට කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇති අවස්ථාවක, එම බදු ගෙවීම ඔප්පු කිරීම සඳහා වන රිසිට්පතෙහි දිනය, එම අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(10) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එසේ කිරීම අවශ්‍ය යයි සලකතහොත්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, ඒ තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද ඒ දැන්වීමෙහි නිශ්චය කරනු ලබන්නා වූ ද යම් ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, ගෙවීලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කළ හැකි ය. තවද එවැනි අභියාචනයක්

විභාග කිරීමට අදාළ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් ඇති වෙනත් යම් කොමසාරිස්වරයකුගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ හෝ තක්සේරුකරුවකුගේ සහාය, එම විභාගයේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා ගත හැකි ය.

(11) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳව වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(12) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචන කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීම පිළිබඳව අභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(13) අභියාචනය නිරාකරණය කර ගැනීම සඳහා අභියාචක විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ගෙවීම් කළ යුතු දිනය 26 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ විලම්භනය කර තිබීම, අභියාචනයක් පිළිබඳ තීරණයට එළඹීමට පෙර කවර හෝ අවස්ථාවක දී කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම.

**35.** 34 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පිහිටුවන ලද සමාලෝචන මණ්ඩලය වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනවලට අදාළ ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වන අභියාචනයකට අදාළ විය යුතු ය.

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන.

**36.** (1) සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු ය :

එසේ වුව ද, අභියාචනාධිකරණයේ මතය සඳහා නීති ප්‍රශ්නයක් ගැන කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) අභියාචනාධිකරණය වෙත හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචන ඉදිරිපත් කිරීමට අදාළ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ අභියාචනයකට අදාළ විය යුතු ය.

## VII වන පරිච්ඡේදය

### තක්සේරුවල අවසානාත්මකභාවය සහ සාවද්‍ය වාර්තා සඳහා දණ්ඩන

තක්සේරු හෝ සංශෝධිත තක්සේරු අවසානාත්මක විය යුතු බව.

**37.** බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ පනතේ නියමිත කාලසීමාව තුළ වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති අවස්ථාවක, අභියාචනයේ දී අවස්ථාවෝචිත පරිදි, කරන ලද හෝ අඩු කරන ලද හෝ වැඩි කරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව, ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්යය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ කිසිවකින්, යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා අභියාචනයේ දී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම් ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙන් තක්සේරුකරුවකු වළක්වනු නොලැබිය යුතු ය.

සාවද්‍ය වාර්තා සඳහා දණ්ඩන.

**38.** යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවක දී, බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත බදු අය කළ හැකි සැපයුම සම්බන්ධයෙන් අයවිය යුතු බද්ද ලෙස ඔහු විසින් දැනටමත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ ද, තක්සේරුව 37 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින්,

ස්වකීය වාර්තාවේ බදු අය කළ හැකි සැපයුම එළිදරව් කිරීමේ දී වංචාවක් හෝ ඕනෑකමින් ම පැහැර හැරීමක් සිදු වී නොමැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් විසිපත් දහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් හිමිකම් පා සිටින මුළු බද්ද සහ වාර්තාව මත ගෙවනු ලබන බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ වගන්තිය යටතේ දණ්ඩනයක් පැනවූ යම් තැනැත්තකු එම බදු අයකළ හැකි කාලසීමාව තුළ කරන ලද වරදකට 66 වන වගන්තිය යටතේ නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### බදු අයකර ගැනීම

**39.** (1) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා "බද්ද" යන්නට මේ පනත යටතේ පනවන ලද හෝ දරන ලද යම් දණ්ඩනයක් ද ඇතුළත් වේ. බදු අයකර ගැනීම.

(2) 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ සහතිකයක් හෝ 44 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන කවර හෝ අවස්ථාවක, පැහැර හැරි තැනැත්තා වෙත ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළ යුතු ය; එහෙත් පැහැර හැරි තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

**40.** ගෙවීම් පැහැර හරිනු ලැබූ යම් බද්දක් පැහැර හැරිය තැනැත්තාගේ සියලුම වත්කම් විෂයයෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය : බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව.

එසේ වුව ද -

(i) 42 වන වගන්තියේ විධිවිධානවලට අනුව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හැරිය තැනැත්තා විසින්, වටිනාකම සඳහා සද්භාවයෙන් මිල දී ගන්නකුට විකුණන ලද යම් වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතු ය ; නැතහොත් බල නොපෑ යුතු ය ;

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට, දේපළ තහනම් කර ලද දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් බද්දට නොලැබිය යුතු ය ;

(iii) චංචල දේපළ සම්බන්ධයෙන් වූ විට, බදු අය කළ හැකි කාලසීමාවන් හතරකට වැඩි කාලයක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගත යුතු බදු අය කළ හැකි කාලසීමාවන් හතරක් පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කර ගනු ලැබූ යම් කුළ අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

පැහැර හැරි තැනැත්තා වෙත කරනු ලබන දැන්වීම.

41. (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට පෙර-

(අ) ඒ බද්දේ විස්තර ; සහ

(ආ) ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව,

සඳහන් කරමින් පැහැර හැරිය තැනැත්තා වෙත ලිඛිත වූ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුවක් කරනු ලැබ ඇති සහ අදාළ බද්ද අයකරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධව ද, නියමිත කාලය ඇතුළත පැහැර හැරිය තැනැත්තා විසින් ඒ තක්සේරුවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති නම්, පැහැර හැරිය

තැනැත්තා විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අය කරනු ලැබූ බද්ධ සම්බන්ධයෙන් විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තව ද, 37 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

42. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනතේ කාර්යය සඳහා බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

තහනමට ගෙන විකිණීමෙන් බද්ද අයකර ගැනීම.

(2) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ ලිපිනය ද ඇතුළත් සහතිකයක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා වෙත, පිස්කල්වරයකු වෙත, නියෝජ්‍ය පිස්කල්වරයා වෙත හෝ බදු එකතු කරන්නකු වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැර හැරිය තැනැත්තාගේ චංචල දේපළ තහනම් කොට විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් බද්ද අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය ලැබූ නිලධරයාට මෙයින් බලය පවරා එසේ අයකර ගන්නා ලෙස ද නියම කරනු ලැබේ.

(3) ඉතාමත් යෝග්‍ය යැයි එකී නිලධරයා කල්පනා කරන ආකාරයකට (2) වන උපවගන්තියේ සඳහන් එකී තහනමට ගැනීම සිදු කළ යුතු අතර එලෙස තහනමට ගත් දේපළ, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම් හා ගාස්තු ගෙවීමට යටත්ව, දින හතක කාලයක් තබා ගත යුතු ය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින හත ඇතුළත ගාස්තු සහ අයකිරීම් ද සමග නොගෙවුවහොත් ප්‍රාදේශීය ලේකම්වරයා, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා, පිස්කල්වරයා, නියෝජ්‍ය පිස්කල්වරයා හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(4) ඒ විකිණීමෙන් ලැබෙන මුදල් –

(i) පළමුව දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු හා අය කිරීම් ගෙවීම සඳහා ද ;

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද යෙදිය යුතු ය.

ශේෂයක් වෙතොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(5) තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබුව ද මේ වගන්තිය යටතේ පැහැර හැරිය තැනැත්තකුට විරුද්ධව නඩු කටයුත්තක දී බදු එකතු කරන්නකු විසින් දරන ලද යුක්ති සහගත වියදම්, ඔහු විසින් යම් පැහැර හැරිය තැනැත්තකුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. මුදල් තහනමට ගනු ලැබූ අවස්ථාවක, එවැනි යුක්ති සහගත වියදම් එසේ තහනමට ගනු ලැබූ මුදලින් පළමුව හිලව් කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ හෝ හිලව් කරනු ලැබූ මුදල් ප්‍රමාණය, පැහැර හැරි තැනැත්තා වෙත ලිඛිත ව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තා වූ ද (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරිය තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක් විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර ද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින් ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නම සහ ලිපින නැතහොත් නම් සහ ලිපිනයන් ද ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට අධිකරණය විසින් ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපල සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල්වරයා සලකන ඉන් යම් කොටසක් හෝ තහනමට ගෙන විකිණීමට බලය දෙන හා නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළ යුතු ය. තව ද සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක් ඇති වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනමට ගැනීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා 'චංචල දේපළ' යන්නට පිරියත හා යන්ත්‍ර ඇතුළත් විය යුතු ය.

අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුත්ත.

**43.** (1) නොගෙවා පැහැර හැරිය බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරි තැනැත්තාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරි තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද දඩයකින් පමණක් දඩුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඩුවම් නොකළ යුතු වරදක් සඳහා ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර එවිට, එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකි ය :

එසේ වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් සලකා බැලීම, විභාග කිරීම හෝ තීරණය කිරීම සඳහා මේ වගන්තියෙහි කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හැරි තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරීම නිසා පැහැර හැරි තැනැත්තා බන්ධනාගාරගත කිරීමකට නියම කරනු ලැබුවා වූ යම් අවස්ථාවක ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල් දිය හැකි ය. නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ (3) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල් දීමෙහි වූ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි ය. තව ද පැහැර හැරිය තැනැත්තාට එලෙස ඇප දීමට නියම කළ විටක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වාරික මගින් ගෙවීමට නියම කරනු ලැබ තිබිය දී ඉන් යම් වාරිකයක් නොගවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු පැවරිය හැකි ය.

ණය ආදියෙන් බද්ද අයකර ගැනීම.

44. (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගවා පැහැර හැර ඇත්තා වූ ද –

(අ) යම් තැනැත්තකු, පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව ; හෝ

(ආ) යම් තැනැත්තකු, පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයාට හෝ සඳහා නැතහොත් ඔහු වෙනුවෙන් මුදල් තබා ගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව ; හෝ

(ඇ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට ගෙවීම සඳහා වෙන යම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව ; හෝ

(ඇ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන් කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව,

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වැඩි නොවන මුදලක් දැන්වීමේ නම් කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් තැපෑලෙන් යැවිය යුතු) ලිඛිත දැන්වීමක් මගින් ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්විය හැකි ය. ඒ දැන්වීම ලැබූ දිනයෙහි දී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලට ද දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ ද සම්බන්ධතාවක් ඇති අන් සියලු තැනැත්තන්ගේ ද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කවර විධිවිධානයක් තිබුණ ද සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඒ ගෙවීම සම්බන්ධයෙන් වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබේ.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දැන්වීමක් දෙනු ලැබූ අවස්ථාවක (1) උපවගන්තියේ සඳහන් මුදල් ඔහුගේ අතට හෝ සන්තකයට භාරගැනීමට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත් වීමෙන් දින දහහතරක් ඇතුළත ඒ කරුණු දන්වා කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත දැන්වීමක් දිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ අවස්ථාවක (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීම ඒ තැනැත්තා

විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, නැතහොත් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් හෝ ඒ තැනැත්තා විසින් අඩුකර ගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකි ව තිබී ඒ බද්ද හෝ ඉන් කොටස (1) උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලසීමාව ඉකුත් වීමෙන් දින දහහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ තැනැත්තා ද ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ අනෙක් ප්‍රධාන නිලධරයා ද, අඩු කර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පෞද්ගලිකව වගකිව යුතු ය. ඒ මුදල මේ පනතින් සලස්වනු ලැබූ සැම මාර්ගයකින් ම අවස්ථාවෝචිත පරිදි ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අය කරගත හැකි ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ නියෝජිතයකු ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතු විය හැකිව තිබූ බද්ද ගෙවීමට පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමෙන් –

(අ) නැසීගිය තැනැත්තකුගේ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු ; හෝ

(ආ) නැසීගිය තැනැත්තකුගේ දේපළවල සන්තකය භාරගන්නා හෝ එබන්දකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ යම් තැනැත්තෙක් ; හෝ

(ඇ) නැසීගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නැවත මුද්‍රා තැබීම සඳහා හෝ දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්,

අදහස් වේ.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන් ගෙන් බදු අය කර ගැනීම.

**45.** (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ආසන්න බව හෝ එසේ බැහැරව යෑමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, එකී බද්දේ විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන ආකාරයට ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යෑම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මහේස්ත්‍රාත්වරයා වෙත තමාගේ සහතිකය නිකුත් කරන වේලාවෙහි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ඒ පිළිබඳව නිවේදනය පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ ලියාපදිංචි කරනු ලැබූ ලිපියක් තැපෑලෙන් යැවීමෙන් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කරනු ලැබිය යුතු ය. එහෙත් එවැනි යම් නිවේදනයක් ඒ තැනැත්තාට නොලැබීමේ හේතුවෙන් මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බදු ගෙවූ බවට හෝ බදු ගෙවීම සඳහා ඇප තැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම නැතහොත් පොලිස් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුට ඒ බදු මුදල් ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ඉඩ හැරීම සඳහා ප්‍රමාණවත් බලයක් විය යුතු ය.

(4) යම් බදු මුදලක් යම් පොලිස් නිලධරයකුට ගෙවනු ලැබූ විට ඒ පොලිස් නිලධරයා විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

බදු අයකර ගැනීමේ මාර්ග එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම.

**46.** මේ පනත යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු සම්පූර්ණ බද්ද මේ පනතේ සලසා ඇති විධිවිධාන එකක් යටතේ අයකර ගත නොහැකි බව හෝ නොහැකි විය හැකි බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වූ අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් 43 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණ ද ඒ නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අය කර ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

බද්ද අයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය.

**47.** යම් තැනැත්තකුගෙන් අය විය යුතු බද්ද අයකර ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඕනෑම තැනැත්තකු වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන නිලධරයාගෙන් හා වෙනත් අයගෙන් බද්ද අයකර ගැනීම.

**48.** (1) IV වන පරිච්ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට කලින් සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් විසින් යම් බද්දක් ගෙවා නොමැති අවස්ථාවක ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ පැහැර හැරීම සඳහා ඒ නිලධරයා වගකිව යුතු වුව ද නො වුව ද, ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයේ කළමනාකරුවකුට, අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයාට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකුට විරුද්ධව යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයේ කළමනාකරුවකුට, අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයකුට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන ආකාරයෙන් පටහැනි ලෙස ඔප්පු කර ඇත්නම් මිස, ඒ නිලධරයා විසින් ඒ පැහැර හැරීම සඳහා වගකිව යුතු සේ සලකා මේ පරිච්ඡේදයේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) IV වන පරිච්ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසින්, යම් බද්දක් ගෙවිය යුතු දිනයේ දී හෝ ඊට පෙර ඒ බද්ද ගෙවා නොමැති අවස්ථාවක දී වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ යම් හවුල්කරුවකු හෝ නිලධරයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන ආකාරයෙන් පටහැනි ලෙස ඔප්පුකර ඇත්තේ නම් මිස එම හවුල්කරු හෝ නිලධරයා විසින් ඒ පැහැර හැරීම සඳහා වගකිව යුතු සේ සලකා මේ පරිච්ඡේදයේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම.

**49.** (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනැමුණු හෝ පැවරුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවකු විසින් ම ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

### විශේෂ අවස්ථා

**50.** යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්‍යතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍යතාවට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය.

අශක්‍යතාවට පත් තැනැත්තකු වෙනුවෙන් කවරකු විසින් ක්‍රියාකළ හැකි ද යන බව.

**51.** යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක දී ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතු ය :

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියාකළ යුතු බව.

එසේ වුව ද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ කොටස්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ ඔහු සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

**52.** (1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය :

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියාකළ යුතු බව.

එසේ වුව ද, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනත යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරනහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය අනුව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියාකළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔප්පු කරනහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් අවසන් වන අවස්ථාවේ දී බද්ද ගෙවීමේ වගකීම.

**53.** (1) මින් මතු සලසා ඇති විධිවිධානවලට යටත්ව, බදු අය කළ හැකි කාලසීමාවක් තුළ දී, බද්ද අය කළ හැකි වූ තැනැත්තකු, ඒ බද්ද අය කළ හැකි වතුයේ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් අවසන් කරන අවස්ථාවක, බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කරගෙන යාම හෝ කිරීම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණ ද, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ දී ඔහු ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කර ගෙන යනු ලැබූ කාලසීමාව සඳහා ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටිය යුතු ය.

(2) බදු අය කළ හැකි ක්‍රියාකාරකම් කර ගෙන යන යම් තැනැත්තකු විසින්, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් යම් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක අයිතිය වෙනස්වීමේ ප්‍රතිඵලය ඇති වන පරිදි සක්‍රිය ව්‍යාපාරයක් වශයෙන් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක, ඒ පැවරුමට පෙරාතුව වූ කාලසීමාව සඳහා ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වූ යම් බද්දක් ඒ පැවරුම්කරුගෙන් අය කර ගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද පැවරුම්ලාභියාගෙන් අය කර ගත හැකි වන අතර, බද්ද එකතු කිරීම හෝ ලබා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

බද්ද ගෙවීම සඳහා පොල්මෑකරු සතු වගකීම,

**54.** (1) බද්ද අය කළ හැකි වූ යම් තැනැත්තකු මියයන අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව ම වූ සියලු ම බදු අය කළ හැකි කාලසීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අය කළ හැකි වූ බද්ද, ඒ තැනැත්තාගේ පොල්මෑකරුගෙන් අය කරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා, ජීවත්ව සිටියේ නම් මේ පනත යටතේ වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේ සම්බන්ධයෙන් ද වගකිව යුතු ය :

එසේ වුව ද–

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මෑකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය ;

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදු වූ දිනට පෙරාතුවම වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන්, මරණය සිදු වූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට අවුරුදු තුනකට පසුව කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය ; සහ

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මෑකරුගේ වගකීම–

(i) මේ වගන්තිය යටතේ බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට පොල්මෑකරුට දැන්වීම් දෙනු ලබන දිනය වන විට ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවැති මිය ගිය තැනැත්තාගේ බූදලේ ප්‍රමාණයට ; සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ බූදලයේ යම් කොටසක ප්‍රමාණයට

සීමා විය යුතු ය.

(2) මිය ගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් පොල්මෑකරුවකු විසින් යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන අවස්ථාවක, එම බදු අය කළ හැකි ක්‍රියාකාරකම මිය ගිය තැනැත්තාගේ බූදලයේ කොටසක් සම්බන්ධයෙන් වන විට, මිය ගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකර ගත යුතු බද්ද, එම බදු අය කළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් පොල්මෑකරුගෙන් අයවිය යුතු ය.

තමන්ට අයත් නොවන බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම.

**55.** බද්දක් ගෙවිය යුතු යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකම් යම් තැනැත්තකු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ නියෝජිතයා වශයෙන් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන්, මේ පනත යටතේ පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අය කළ යුතු ආකාරයට ම හා ප්‍රමාණයටම, බද්ද අයකර ගත යුතු ය.

ඒකාබද්ධ භාරකරුවන් හා පොල්මෑකරුවන්.

**56.** තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මෑකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ පනත යටතේ ඔවුන්ගෙන් අය කළ හැකි වන

බද්ද සාමූහිකව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකි වන අතර, ඒ බද්ද සාමූහිකව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

සමාගමක් ඈවර කිරීමේ දී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේ දී බද්ද ගෙවිය යුතු වන නැනැත්තන්.

**57.** (1) 1982 අංක 17 දරන සමාගම් පනතේ කුමක් සඳහන් වුව ද, සමාගමක් ඈවර කරනු ලබන අවස්ථාවක හා ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් බද්දක් අයකර ගත නොහැකි වූ අවස්ථාවක, බද්ද අය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම නැනැත්තකු ම බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දළ නොසැලකිල්ලට, ව්‍යතික්‍රමයකට හෝ යුතුකම් පැහැර හැරීමකට ආරෝපණය කල නොහැකි බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් සාමූහිකව හා වෙන් වෙන් වශයෙන් වගකිව යුතු වන අතර, බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(2) සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලැබ ඇත්තා වූ ද, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු යම් බද්දක් අයකර ගැනීමට නොහැකිව ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ බද්ද ගෙවිය යුතුව තිබුණු කාල පරිච්ඡේදය තුළ යම් කාලයක දී ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකුව හෝ නිලධරයකුව සිටි සෑම නැනැත්තකුම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ කටයුතුවලට අදාළව තමන්ගේ යම් දළ නොසැලකිල්ලකට, බලය අනිසි ලෙස පාවිච්චි කිරීමකට හෝ යුතුකම් පැහැර හැරීමකට හෝ ආරෝපණය නොකළ හැකි බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ බද්ද ගෙවීම සාමූහිකව හෝ වෙන් වෙන්ව වගකිව යුතු අතර බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

## X වන පරිච්ඡේදය

## බදු ආපසු ගෙවීම

වැඩිපුර බද්ද ආපසු ගෙවීම.

**58.** (1) ලියාපදිංචි නැනැත්තකු විසින් වැඩිපුර ගෙවා ඇති යම් බදු මුදලක් හෝ දඩ මුදලක් ආපසු අයකර ගැනීම සඳහා ඉල්ලුම් කරමින් එම කාලසීමාව සඳහා ගෙවීමට තමා යටත්ව සිටි මුදලට වඩා වැඩි මුදලක් ඒ නැනැත්තා විසින් බදු වශයෙන් හෝ දඩ මුදලක් වශයෙන් ගෙවා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරයි නම්, (3) වන උපවගන්තියේ

විධිවිධානවලට යටත්ව, බදු අය කළ හැකි කාලසීමාව තුළ දී වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු ලබා ගැනීමට එම තැනැත්තාට හිමිකම් ඇත :

එසේ වුව ද, ලියාපදිංචි තැනැත්තකු විසින් වැඩිපුර ගෙවා ඇති 22 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල සඳහන් එවැනි යම් මුදලක්, ඒ අතිරික්තය ඇති වූ, බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට එක් මාසයක් ඇතුළත හෝ ඒ බදු අය කළ හැකි කාලසීමාව සඳහා වාර්තාව ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත යන මෙයින් පසුව යෙදෙන කාලය ඇතුළත ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ හිමිකම්පෑමක් කිරීමට හිමිකම ඇති ලියාපදිංචි කළ තැනැත්තකුට මරණය, අශක්‍යතාව බුන්වත් බව, ඇවර කිරීම හෝ වෙනත් හේතුවක් නිසා, හිමිකම්පෑමක් කිරීමට නොහැකි වූ අවස්ථාවක, (1) වන උපවගන්තියේ අර්ථානුකූලව වැඩිපුර ගෙවා ඇති යම් බදු මුදලක් හෝ දඩ මුදලක් ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ බූදලයේ වාසිය සඳහා ආපසු ලබාගැනීමට, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ පොල්මෑකරුට, භාරකරුට හෝ දේපළ ලබන්නාට හිමිකම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද–

(අ) යම් ලියාපදිංචි කළ තැනැත්තකු විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් වෙනුවෙන් වූ යම් බද්දක් නියමිත දිනයට කලින් මුළු ප්‍රමාණයම හෝ එහි යම් කොටසක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීම පැහැරහැර ඇති අවස්ථාවක, ඒ තැනැත්තාට නිසි දැන්වීම කිරීමෙන් පසු, ඒ නොගෙවා ඇති බද්දට එරෙහිව, ඒ තැනැත්තාට අන්‍යාකාරයෙන් ආපසු ගෙවිය යුතු යම් මුදලක් හෝ යම් මුදලක කොටසක් හෝ 59 වන වගන්තිය යටතේ ගෙවිය යුතු පොලී මුදලක හෝ පොලී මුදලක යම් කොටසක් හිලව් කරනු ලැබිය හැකි අතර එසේ හිලව් කරන ලද යම් මුදලක් ඒ ලියාපදිංචි කළ තැනැත්තාගෙන් ලැබුණු ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ලියාපදිංචි කළ යම් තැනැත්තකු විසින් බදු ගෙවිය හැකි යම් කාලසීමාවක් වෙනුවෙන් වූ වාර්තාවක් සපයා නොමැති අවස්ථාවක, ඒ ලියාපදිංචි කළ තැනැත්තා විසින් ඒ වාර්තා සපයන තෙක්, අන්‍යාකාරයෙන් ආපසු ගෙවිය යුතු යම් මුදලක් හෝ මේ පනතේ 59 වන වගන්තිය යටතේ ගෙවිය යුතු පොලියක යම් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවීම කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්හිටුවනු ලැබිය හැකි ය.

ආපසු ගෙවීම මත පොලී.

**59.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කළ තැනැත්තකුට ආපසු ගෙවිය යුතු යම් මුදලක් ඒ ගෙවීම කළ යුතු නියමිත දිනයේ සිට දින තිහක කාලයක් ඇතුළත ආපසු ගෙවා නොමැති අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියමිත දිනයේ සිට තිස් වන දිනයෙන් ආරම්භව, මේ පනත යටතේ ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් ආපසු ගෙවීමට නියම කරනු ලැබ ඇති මුදල ආපසු ගෙවන දිනය තෙක්, එම ප්‍රමාණය මත කලින් කල අමාත්‍යවරයා විසින් කලින්කල නියම කරනු ලබන අනුප්‍රමාණයන් අනුව පොලිය ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ලියාපදිංචි තැනැත්තාගේ යම් වාර්තාවක් සම්බන්ධයෙන් තක්සේරුකරු විසින් කරනු ලැබූ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම ඒ ලියාපදිංචි තැනැත්තා විසින් ප්‍රමාද කොට ඇති අවස්ථාවක දී එවැනි කිසිදු පොලියක් නොගෙවිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "නියමිත දිනය" යන්නෙන්–

(i) අභියාචනය කරනු ලැබූ තක්සේරුව සම්බන්ධයෙන් තක්සේරුකරු සමග එකඟත්වයකට පැමිණි දිනයේ සිට හෝ අභියාචනය නිශ්චය කරනු ලැබූ දිනයේ සිට ; හෝ

(ii) 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ලියවිල්ලකින් කරන ලද ආපසු ගෙවීමක් සඳහා වූ හිමිකම් පෑමක් නොවන, ඒ තැනැත්තාගෙන් ලියවිල්ලකින් වූ හිමිකම් පෑමක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දිනයේ සිට,

දින අනුවකින් අවසන් වන කාලසීමාව අදහස් වේ.

## XI වන පරිච්ඡේදය

### විවිධ කරුණු

අත්සන හා දැන්වීම භාරදීම.

**60.** (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවකු විසින් දිය යුතු සෑම දැන්වීමකම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමකම කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි තියි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබුණහොත්, වලංගු විය යුතු ය.

(2) මේ පනතේ බලය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිට වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාළ වන කාලසීමාව ඇතුළත ඔහු බදු අයකළ හැකි ක්‍රියාකාරකමෙහි නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාර දීමෙන් නැතහොත් තැපැලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාරදිය හැකි ය.

(3) තැපැලෙන් යවනු ලැබූ සෑම දැන්වීමක් ම, තැපැලට ගතවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපැලෙන් භාරදීම ඔප්පු කිරීමේ දී දැන්වීම් ඇතුළත් ලිපිය යථාපරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(5) මේ පනතේ කාර්යය සඳහා වූ යම් දැන්වීමක් හෝ සහතිකයක් දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නම යයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ, අත්සන් කර හෝ තිබේද, නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේ ද ඒ සෑම නමක් ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

දැන්වීම, තක්සේරු කිරීම ආදියෙහි වලංගු භාවය.

**61.** (1) මේ පනතේ විධිවිධානවලට අනුකූල යයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේ නම් හෝ ගැලපේ නම් සහ

තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන තැනැත්තා, පොදු අධ්‍යාශයට හෝ වැටහීමට අනුව ඒ දැන්වීමෙහි, තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කටයුත්තෙහි නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම බදු අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථාපරිදි භාර දී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමෙහි සඳහන් කර ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක්–

(අ) බදු අය කර ගනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකමේ ප්‍රමාණය හෝ අය කළ හැකි බදු ප්‍රමාණය පිළිබඳව හෝ යම් වරදක් ඒ තක්සේරුවෙහි තිබීම ; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර යම් වෙනසක් තිබීම

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතු ය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය.

62. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය :—

(අ) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ කටයුත්තට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන ගිණුම් පොත්, ලේඛන වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ එවැනි ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි සොයාගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම ;

(ආ) එවැනි ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ ඒවායේ හඳුනාගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම ;

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුත්තකට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි ඔහුට අදහස් වන වෙනත් යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තව ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ සෝදිසි කිරීම්වලට ද හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

මේ උපවගන්තියෙහි "සාම නිලධරයා" යන්නෙහි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවීමට තුඩුදුන් හේතු කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තාගත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් තම සන්තකයට ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අවශ්‍ය තාක් කල් ඒ නිලධරයාගේ සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

බදු අයකළ හැකි ක්‍රියාකාරකම පවත්වාගෙන යනු ලබන හෝ පවත්වන ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය.

**63.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි ය :—

(අ) මෙම පනතේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේ දැයි තීරණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම ;

(ආ) එහි දී සොයාගනු ලැබිය හැකි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහි දී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම ;

(ඇ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම හා පිටපත් හෝ උධෘත ගැනීම ;

(ඈ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් සන්තකයට ගැනීම හෝ එහි හඳුනා ගැනීමේ ලකුණු තැබීම ;

(ඉ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන් කොට ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම ;

(ඊ) මේ පනත යටතේ වූ කරුණු සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් සැපයීමට බලය ඇති යම් තැනැත්තකු ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ සිට සොයා ගනු ලැබූ විට, තමා දන්නා ඒ තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම ;

(උ) තමා යෝග්‍ය යයි අදහස් කරන පරිදි, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී මේ පනතේ කරුණු සම්බන්ධයෙන් එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක සිට තමා විසින් සොයා ගනු ලැබූ සෑම තැනැත්තකු ම පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තමා සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල සන්තකයට ගනු ලැබූ දින සිට අවුරුදු තුනක් නොඉක්මවන කාල සීමාවකට ඒ නිලධරයා සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය :

එසේ වුවද, 66 වන හෝ 67 වන වගන්ති යටතේ ඕනෑකමින් ම මගහැරීමක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, එවැනි, පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක්, එම නඩුව පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන තාක් කල් රඳවා තබාගත හැකි ය.

වාර්තා තබා ගැනීම.

**64.** (1) බදු ගෙවීමට ඇති වගකීම කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකුට දැන ගැනීමට හැකි වන පරිදි සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම කර ගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අය කළ හැකි කටයුතු සම්බන්ධයෙන් වාර්තා තබා ඒවා පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තබා ගත යුතු වාර්තාවල ආකෘති පත්‍ර සහ ඒවායේ දැක්විය යුතු විස්තර නියම කරනු ලබන පරිදි විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා වාර්තා යන්නට –

(අ) ලැබීම හෝ ආදායම හෝ වියදම සටහන් කර ඇති (අතින් ලියන ලද හෝ යන්ත්‍රානුසාරයෙන් යුක්ත වූ හෝ විද්‍යුත් ආකෘතියක ආකාරයට වූ නැතහොත් ඒවායේ

සංයෝජකයන් වන්නා වූ) ගිණුම් පොත් ඇතුළත් වන අතර, වවුචර්, බැංකු ප්‍රකාශ, ඉන්වොයිස් පත්‍ර, බදු ඉන්වොයිස් පත්‍ර, බදු බැර සටහන් නෝට්ටු, බදු හර සටහන් නෝට්ටු, ලදු පත් සහ එවැනි ගිණුම් පොත් වල සටහන් සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ලියකියවිල ද ;

(ආ) යම් භාණ්ඩ තොග තබා ඇත්තේ අවස්ථාවෝචිත පරිදි යම් ගුදමක, ගබඩාවක හෝ වෙනත් යම් ස්ථානයක ද එම ගුදම, ගබඩාව හෝ වෙනත් යම් ස්ථානය පිළිබඳ විස්තරය හා ඒවායේ ඇති තොග පිළිබඳ විස්තර ;

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව පවත්වා ගැනීමට හෝ තබා ගැනීමට නියමිත යම් ලැයිස්තුවක් හෝ වාර්තාවක්

ඇතුළත් වේ.

## XII වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

රහස්‍යතාව ආදිය කඩ කිරීමට අදාළ දණ්ඩන විධිවිධාන.

65. (අ) 73 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එසේ දිවුරුම් දීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) 73 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කටයුතු කරන්නා වූ ; හෝ

(ඇ) මේ පනතේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ පොළඹ වන්නා වූ

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ව.එ.බ. සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන.

66. (අ) මේ පනතේ විධිවිධාන අනුව හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන

ලෙස හෝ ඉල්ලා සිටිනු ලැබූ විට වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් හෝ අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ; හෝ

(ආ) මේ පනත යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුනු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නා වූ ; හෝ

(ඇ) මේ පනත යටතේ යම් අසත්‍ය වාර්තාවක් සපයන්නා වූ හෝ මේ පනත යටතේ සපයනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ,

සහ එමගින් බදු ගෙවීම මගහරින්නා වූ හෝ මග හැරීමට තැත් කරන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකුට ඒ බදු ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට හෝ ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට–

(i) වරද කරනු ලැබුවේ යම් බදු අය කළ යුතු කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ බදු අය කළ යුතු කාලසීමාව සඳහා අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ යටත්ව සිටින්නා වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත්කළා වූ ද බදු ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලින් ; සහ

(ii) රුපියල් විසි පන්දහසක් නොඉක්මවන මුදලකින්,

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**67.** දැන දැනම - වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන.

(අ) 10 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම පැහැර හරින්නා වූ ද ; හෝ

(ආ) 19 වන වගන්තිය යටතේ දැනුම්දීමට නියමිත ඇතැම් කරුණු කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම පැහැර හරින්නා වූ ; හෝ

(ඇ) 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමිත පරිදි බදු ඉන්වොයිසියක් හෝ 20 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ඉන්වොයිසියක් නිකුත් කිරීම පැහැර හරින්නා වූ ; හෝ

(ඈ) බදු අය කළ හැකි සැපයුමක් සඳහා බදු ඉන්වොයිස් පත්‍ර එකකට වැඩි ගණනක් නිකුත් කරන්නා වූ ; හෝ

(ඉ) 20 වන වගන්තිය යටතේ ඒ බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් නැති අවස්ථාවක බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ ; හෝ

(ඊ) 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සැපයීම හෝ 21 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

(උ) 21 වන වගන්තිය හෝ 34 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් මෙම පනත යටතේ නීත්‍යනුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම සැහෙන හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ; හෝ

(ඌ) බද්දට තමා යටත්වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සපයන්නා වූ ; හෝ

(එ) 44 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් කොමසාරිස් ජනරාල්වරයාට හැර වෙනත් යම් තැනැත්තකුට ගෙවීමට අවසර දෙන්නා වූ ; හෝ

(ඒ) 62 වන වගන්තිය හෝ 63 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට සිතා මතා බාධා කරන හෝ ඔවුන් ප්‍රමාද කරන්නා වූ ; හෝ

(ඔ) 64 වන වගන්තියෙන් නියමිත වාර්තා පවත්වාගෙන යාම පැහැර හරින්නා වූ ; හෝ

(ඕ) මේ පනත යටතේ ලියාපදිංචි නොවුණු තැනැත්තකු වශයෙන් බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරන්නා වූ,

යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයන්ට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

නඩු පැවරීම කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව.

**68.** මේ පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතු ය.

වැරදි සමථයට පත්කිරීම.

**69.** මේ පනත යටතේ වූ වරදක් සිදු කරන ලද්දේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද ඒ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව මේ පනත යටතේ ඒ වරද සඳහා පැනවිය හැකි උපරිම දඩ මුදලින් තුනෙන් එකක් නොඉක්මවන මුදලක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කිරීමෙන් කොමසාරිස් ජනරාල්වරයාට ලැබුනා වූ මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## XIII වන පරිච්ඡේදය

### පරිපාලනය

නිලධරයෝ.

**70.** (1) මේ පනත ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි දේශීය ආදායම් කොමසාරිස්වරුන්, දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරුන්, දේශීය ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන්, දේශීය ආදායම් තක්සේරුකරුවන් සහ දේශීය ආදායම් බදු නිලධරයන් සංඛ්‍යාවකගේ සහාය ඇතිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මේ පනතේ පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) (අ) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය හෝ කර්තව්‍යයක් ඉටුකිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් කොමසාරිස්වරයකුට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට බලය පවරනු ලැබිය හැකි ය.

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යක් හෝ කර්තව්‍යයක් ඉටු කරන දේශීය ආදායම් කොමසාරිස්වරයකුට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට, බලය දෙනු ලැබ ඇති ලෙස, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ යම් විධිවිධානයක් මගින් තක්සේරුකරුවකු වෙත, පවරනු ලැබූ නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් දේශීය ආදායම් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කිරීම ද, ඉටු කිරීම ද කරනු ලැබිය හැකි ය.

එකතු කළ අගය මත බද්ද ආපසු ගෙවීමේ අරමුදල.

71. (1) එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එම අරමුදලට, 2002 අගෝස්තු 1 වන දිනයෙන් ආරම්භ වන මාසයේ සිට ආරම්භව, සෑම මාසයකම එකතු කරනු ලබන එකතු කළ අගය මත බද්දෙන් සියයට විසිපහක්, ඒ ඒ මාසයෙන් ඉක්බිතිවම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර, අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට අනුකූලව හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතු සියලු ආපසු ගෙවීම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) (අ) අරමුදල, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලක් මගින් බලය පවරනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(ආ) ආපසු ගෙවීම් කරනු ලැබිය යුතු ක්‍රමය සහ ආකාරය සම්බන්ධව නියෝග සාදනු ලැබිය හැකි ය.

72. වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද තක්සේරු කිරීමේ සහ ඒ තැනැත්තාගෙන් බදු අයකර ගැනීමේ ප්‍රතිඵලය ඇතිවන තොරතුරක් සපයන යම් පුද්ගලයකුට, ඒ කාරණයට අදාළ අවස්ථානුගත කරුණු අනුව යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, තෑගි මුදල් ගෙවීමේ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් විසර්ජනය කරනු ලබන මුදල්වලින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවනු ලැබිය හැකි ය.

මත්තු සපයන්නන්ට කොමසාරිස් ජනරාල්වරයා විසින් තෑගි මුදල් ගෙවනු ලැබිය හැකි බව.

73. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයේ නියුක්ත කරවනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතු ය. තව ද ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හැර, වෙන යම් තැනැත්තකුට එවැනි යම් කරුණක් නොදැන්විය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට අවසර දීම හෝ ඉඩ හැරීම නොකළ යුතු ය.

නිල රහස්‍යභාවය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළයුතු අතර, අමාත්‍යවරයා විසින් හා මුදල් විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු ය :

එසේ වුව ද, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ දෙන ලද දිවුරුමක් මේ පනත යටතේ දෙන ලද දිවුරුමක් ලෙස සැලකිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක් හෝ ලේඛනයක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ යම් කාරණයක් හෝ දෙයක් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැක්වීමට හෝ නියම කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ හෝ එවැනි වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යක් ඉටු කිරීම සඳහා ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය නම්, ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට දැනුම්දීම කළ හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇත ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් තම සන්තකයෙහි ඇති, යම් වාර්තාවක් හෝ ලේඛනයක පිටපතක්, එය සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය :

එසේ වුව ද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය :

එසේ ම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කරන ලෙස කවර හෝ අවස්ථාවක දී කොමාසාරිස් ජනරාල්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා නිසියාකාරව බලය දෙනු ලැබූ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධරයකුට, ස්වකීය නිල කාර්යය කිරීමට අවශ්‍ය විය හැකි යම් වාර්තා හෝ ලේඛන ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දිය හැකි ය. විගණකාධිපතිවරයා හෝ මේ උපවගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු මේ පනතේ විධිවිධාන ඉටු කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ තැනැත්තකු වශයෙන් මෙම වගන්තියෙහි (2) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, රේගු ආඥාපනත හෝ සුරාබදු ආඥාපනත හෝ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ යම් තැනැත්තකු විසින් වරදක් කර ඇති බව, මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයකින් කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, ඒ වරද කිරීම හා සම්බන්ධව යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කරනු ලැබූ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් යම් භාණ්ඩ, ගිණුම් පොත් හෝ වෙනත් යම් ලේඛන පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, සුරාබදු කොමසාරිස්වරයාට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් දැනුම් දීම හෝ ඒවා භාරදීම කළ හැකි ය.

74. මේ පනතේ සියලු කාර්ය හෝ ඉන් කිසිවක් සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නිශ්චය කොට දක්වනු ලැබිය හැකි අතර එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘති පත්‍රයක් කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නිශ්චය කොට දක්වනු ලැබූ යම් ආකෘති පත්‍රයක් වෙනුවට වෙන යම් ආකෘති පත්‍රයක් ආදේශ කිරීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ හැකි ය. ආකෘති පත්‍ර.

75. (1) නියම කළයුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## XIV වන පරිච්ඡේදය

### අන්තර්කාලීන විධිවිධාන සහ අත්හැරීම්

අන්තර්කාලීන විධිවිධාන.

**76.** 2002 අගෝස්තු 1 වන දිනයේ දී හෝ ඉන් පසු හෝ අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින්, යම් නිදහස් කළ සැපයුම් කිරීමේ කාර්යය සඳහා භාණ්ඩ අත්කර ගැනීම මත බද්ද ගෙවීමට යෙදී ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ සැපයුම, බදු අයකළ හැකි සැපයුමක් බවට ඉන් අනතුරුව පත් වී සහ එසේ අත්කරගත් භාණ්ඩ, ඒ බදු අයකළ හැකි සැපයුම කිරීම සඳහා භාවිත කරන විට, ඒ තැනැත්තා විසින් එසේ ගෙවන ලද බද්ද යෙදවුම් බද්ද ලෙස සැලකිය යුතු ය :

එසේ වුවද, එසේ අත්කරගත් භාණ්ඩ යම් බදු අයකළ හැකි සැපයුමක් කිරීමෙහි ලා අර්ධ වශයෙන් පමණක් භාවිත කරන අවස්ථාවක, යෙදවුම් බද්දෙන් ඉඩදිය හැකි ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය.

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම.

**77.** 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ භාණ්ඩ හා සේවා බද්ද සහ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත පිළිබඳව ඇති සියලු සඳහන් කිරීම්වලට 2002 අගෝස්තු 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කවර හෝ තක්සේරු වර්ෂයක් හෝ තක්සේරු වර්ෂයකින් කොටසක් සඳහා වූ එකතු කළ අගය මත බද්ද පිළිබඳ සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත පිළිබඳ සඳහනක් ඇතුළත් වන ලෙසට කියවා තේරුම් ගත යුතු ය.

**78.** (1) යම් ලියාපදිංචි තැනැත්තකු විසින්, යම් භාණ්ඩයක් වෙනත් යම් භාණ්ඩයක් තැනීම සඳහා පාවිච්චියට නොගෙන විකිණීම සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කිරීම වෙනුවෙන් 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 5අ වගන්තිය යටතේ 2002 අගෝස්තු 1 වන දිනට පෙර ජාතික ආරක්ෂක බදු ගෙවන ලද බව 2002 දෙසැම්බර් 31 වන දිනට පෙර ලියවිල්ලක් මගින් හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමෙන් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ සහ එම භාණ්ඩ සැපයුම වෙනුවෙන් 2002 අගෝස්තු 01 වන දිනට පෙර, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ, සියයට දොළහමාර බැගින් බදු අය කළ හැකි, සහ එසේ ආනයනය කළ භාණ්ඩ හෝ ඉන් යම් කොටසක් එකී ලියාපදිංචි තැනැත්තාගේ වෙළෙඳ බඩු තොගය අවසන් 2002 ජූලි 30 වන දිනට ඉතිරිව ඇත්තා වූ හා එම වෙළෙඳ බඩු තොගය, මේ පනත යටතේ බදු අයකළ හැකි සැපයුම් කිරීමේදී සපයනු ලබන්නා වූ අවස්ථාවක, එසේ ගෙවන ලද ජාතික ආරක්ෂක බද්ද හෝ ඉන් කොටස, යෙදවුම් බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ හිමිකම් පෑම කොමසාරිස් ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ බදු අය කළ හැකි කාලසීමාවෙන් ආරම්භ වන යම් බදු අයකිරීමේ කාල සීමාවක දී, එය යෙදවුම් බදු බැර කිරීමක් ලෙස ඉඩහරිනු ලැබිය හැකි ය.

1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවන ලද ජාතික ආරක්ෂක බද්ද යෙදවුම් බද්ද ලෙස සැලකෙන බව.

(2) එසේ යෙදවුම් බදු ලෙස සැලකෙන බද්දට ආරෝපණය කළ හැකි යම් යෙදවුම් බදු අතිරික්තයක් ආපසු නොගෙවිය යුතු අතර, 22 වන වගන්තියේ (3) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණද, බදු අයකළ හැකි ඊළඟ කාලසීමාවෙන් කාලසීමාවට එය ඉදිරියට ගෙන යා යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලා සිටිනු ලැබ යෙදවුම් බදු බැර වශයෙන් ඉඩ හරිනු ලැබූ යම් අතිරික්ත හෝ අයථා හිමිකම් පෑමක්, ඉල්ලා සිටිනු ලැබූ අතිරික්ත යෙදවුම් බද්දක් ලෙස සැලකිය යුතු අතර, 22 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තක්සේරු කරනු ලැබිය යුතු ය.

**79.** 20 වන වගන්තියේ (1) වන සහ (6) වන උපවගන්ති යටතේ නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා පවත්නා ඉන්වොයිසි ක්‍රමය වෙනස් කිරීමේ දී මතුවන නිශ්චිත ගැටළු නිසා, එම උපවගන්තිවලට අනුව ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින යම් තැනැත්තකු, 2002 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර එම නියමයන් අනුව ක්‍රියා කිරීමට පොරොන්දු වන්නේ නම් සහ

මුක්තිය.

2002 අගෝස්තු 1 වන දින සිට එම නියමයන්ට අනුව හැකි උපරිම පමණින් ක්‍රියා කර එම ඉන්වොයිසි නිකුත් කිරීමට වැඩපිළිවෙලක් යොදන්නේ නම්, ඒ තැනැත්තා, 2002 අගෝස්තු 01 දින සිට 2002 සැප්තැම්බර් 30 දින දක්වා කාලය තුළ, එම නියමයන්ට අනුකූලව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ දණ්ඩනයකට හෝ යටත් නොවිය යුතු ය.

ඉතිරි කිරීම.

**80.** (1) 2002 අගෝස්තු 1 වන දිනට පෙරාතුව ම දිනයේ දී බලාත්මකව පැවති සහ මේ පනත යටතේ නිකුත් කරන ලද විධාන, නිවේදන, නියෝග හා ආකෘති පත්‍ර ලෙස සැලකිය යුතු, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ –

(අ) 23 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සියලු විධාන ;

(ආ) 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් නිවේදනයක් ;

(ඇ) (i) 74 වන වගන්තියේ යටතේ ;
(ii) 65 වන වගන්තිය යටතේ ;

අමාත්‍යවරයා විසින් සාදන ලද සියලු නියෝග ; සහ

(ඇ) 73 වන වගන්තිය යටතේ නියමිත සියලු ආකෘති පත්‍ර, පරිච්ඡින්න කරන තෙක් හෝ මේ පනත යටතේ කරන ලද විධාන හා නිවේදන මගින් ප්‍රතියෝජනය කරනු ලබන තෙක් බලාත්මකව පවතින්නේ ය.

(2) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 13 වන වගන්තිය යටතේ ලියාපදිංචි සෑම තැනැත්තකු ම මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු ලෙස සැලකිය යුතු අතර, 2002 අගෝස්තු 1 වන දිනට පෙර බලාත්මකව පවතින ලියාපදිංචි තැනැත්තකුට 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ 15 වන වගන්තිය යටතේ වෙන්කොට නිකුත් කරන ලද සෑම බදු ලියාපදිංචි අංකයක් සහ ලියාපදිංචි සහතිකයක් සියලු කාර්ය සඳහා මේ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් සහ ලියාපදිංචි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## XVI වන පරිච්ඡේදය

### ජාතික ආරක්ෂක බද්ද සහ භාණ්ඩ හා සේවා බද්ද අහෝසි කිරීම

**81.** 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ කවර විධිවිධානයක් තිබුණ ද, ඒ පනත අදාළ වන කිසිම තැනැත්තකුගෙන් 2002 අගෝස්තු 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන කවර හෝ කාර්තුවක් හෝ කාර්තුවක කොටසක් වෙනුවෙන් ජාතික ආරක්ෂක බද්ද අයකර නොගත යුතු ය : 2002 අගෝස්තු 1 වන දින සිට ජාතික ආරක්ෂක බද්ද අයකිරීම අහෝසි කිරීම.

එසේ වුවද 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත අදාළ වන කවර හෝ තැනැත්තකු විසින්, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, 2002 ජූලි මාසය සඳහා ඒ පනත යටතේ වාර්තාවක් සැපයිය යුතු ය.

**82.** 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ කවර විධිවිධානයක් තිබුණ ද ඒ පනත අදාළ වන කිසිම තැනැත්තකුගෙන් 2002 අගෝස්තු 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන කවර හෝ බදු අයකිරීමේ කාලසීමාවක් හෝ බදු අයකිරීමේ කාල සීමාවක කොටසක් වෙනුවෙන් භාණ්ඩ හා සේවා බද්ද අයකර නොගත යුතු ය : 2002 අගෝස්තු 01 වන දින සිට භාණ්ඩ හා සේවා බද්ද අයකිරීම අහෝසි කිරීම.

එසේ වුවද 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ ලියාපදිංචි කවර හෝ තැනැත්තකු විසින්, ඒ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, 2002 ජූලි මාසය සඳහා ඒ පනත යටතේ වාර්තාවක් සැපයිය යුතු ය.

## XVII වන පරිච්ඡේදය

### අර්ථ නිරූපණය

**83.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි — අර්ථ නිරූපණය.

"තක්සේරුකරු" යන්නෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරනු ලැබූ තක්සේරුකරුවකු හෝ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු අදහස් වේ ;

"ආශ්‍රිත තැනැත්තන්" යන්නෙන් —

(අ) එකම කොටස් හිමියන්ගෙන් සමන්විත වන්නා වූ හෝ එකම අධ්‍යක්ෂවරුන් විසින් කළමනාකරණය සහ පාලනය කරනු ලබන්නා වූ සමාගම් දෙකක් නැතහොත් ඊට වැඩි සංඛ්‍යාවක් ; හෝ

(ආ) යම් සමාගමක යම් කොටස් හිමියකු විසින් හෝ ඒ කොටස් හිමියාගේ කලත්‍රයා හෝ දරුවකු හෝ භාරකරුවකු විසින් හෝ, ඒ කොටස් හිමියාගේ කලත්‍රයාගේ නැතහොත් දරුවාගේ යම් භාරකරුවකු විසින් හෝ, එක්ව නැතහොත් වෙන් වෙන්ව ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ ඒ සමාගමේ වෙන්කර දුන් කොටස්වල නාමික අගයෙන් සියයට විසිපහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ දරන්නේ ද එවැනි සමාගමක් හෝ කොටස් හිමියකු ; හෝ

(ඇ) යම් පුද්ගලයන් දෙදෙනකු අතුරින් එක් පුද්ගලයකු අනෙක් පුද්ගලයාගේ කලත්‍රයා හෝ දරුවකු හෝ එම කලත්‍රයාගේ නැතහොත් දරුවාගේ භාරකරුවකු වේ ද එවැනි පුද්ලයන් දෙදෙනකු ; හෝ

(ඈ) හවුල් ව්‍යාපාරයන් සහ පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයා ඒ හවුල් ව්‍යාපාරයේ යම් හවුල්කරුවකුගේ ඥාතියකු වේ නම් එවැනි හවුල් ව්‍යාපාරයක් සහ පුද්ගලයකු ; හෝ

(ඉ) ඒකාබද්ධ ව්‍යවසායක් සහ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා ඒ ඒකාබද්ධ ව්‍යවසායේ සාමාජිකයකුගේ ඥාතියකු වේ නම් එවැනි ඒකාබද්ධ ව්‍යවසායක් සහ තැනැත්තකු ; හෝ

(ඊ) යම් තැනැත්තන් දෙදෙනකු අතුරින් එක් තැනැත්තකු අනෙක් තැනැත්තාගේ භාරකරු වේ නම් එවැනි තැනැත්තන් දෙදෙනෙකු ; හෝ

(උ) එකිනෙකාට ඥාති සම්බන්ධයක් ඇති යම් තැනැත්තන් දෙදෙනකු ;

(ඌ) යම් ක්‍රියාකාරකමක් වෙන් වෙන්ව හෝ එක්ව කරගෙන යන්නා වූ ද වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් නිෂ්පාදනය කළ නොහැකි අනන්‍ය භාණ්ඩ හෝ සේවා සැපයුම එහි ප්‍රතිඵලය ලෙස ලැබී ඇත්තා වූ ද යම් තැනැත්තන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ;

අදහස් වේ.

"බලයලත් නියෝජිතයා" යන්නට 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත මගින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"පුද්ගල මණ්ඩලය" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, යම් සහෝදරත්වයක්, මිත්‍ර සංගමයක්, සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක්, යම් හවුල් ව්‍යාපාරයක් සහ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් හෝ නිශ්චල දේපළවල සම අයිතියක් ඊට ඇතුළත් වේ ;

"පොත්" යන්නට දිනපොත්, චෙක්පොත්, අභ්‍යාස පොත්, හෝ ලෙජර් පොත් ඇතුළත් නොවිය යුතු ය.

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයක් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ කොමසාරිස්වරයෙක් සහ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් අදහස් වේ ;

"සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවේ හෝ අන්කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වේ ;

"රේගු බන්ධිත ප්‍රදේශය" යන්නෙන් –

(අ) රේගු ආඥා පනතේ 69 වන වගන්තිය යටතේ අනුමත කරන ලද බන්ධිත ගුදමක් ;

(ආ) රේගු ආඥා පනතේ 84අ වගන්තිය යටතේ අනුමත කරන ලද බන්ධිත ගුදමක් ;

(ඇ) රේගු ආඥා පනතේ 167 වන වගන්තියෙන් විග්‍රහ කරනු ලැබ ඇති ජනරජයේ ගුදමක් ;

(ඈ) රේගු දෙපාර්තමේන්තුවේ නියාමනයට යටත්ව පවත්නා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් වෙළෙඳ කලාපයක්,

අදහස් වේ.

"ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු" යන්නෙන් ශ්‍රී ලංකාවේ වෙනත් තැනැත්තකු සඳහා ගොඩනැගිල්ලක්, පාරක්, පාලමක්, ජලසම්පාදන පද්ධති, ජලාපවහන පද්ධති, කසළ අපවහන පද්ධති, විදුලිබල උත්පාදන හෝ සම්ප්‍රේෂණ පද්ධති හෝ වෙනත් යටිතල පහසුකම් ව්‍යුහයක් ඉදිකිරීම සඳහා සේවා සැපයීමට ඒ වෙනත් තැනැත්තා සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළත් වී ඇති යම් තැනැත්තෙක් අදහස් වේ ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි වූ අධ්‍යක්ෂවරයකු අදහස් වන අතර ඊට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු ද ඇතුළත් වේ ;

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද දේශීය ආදායම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු අදහස් වේ ;

"අධ්‍යාපන ආයතනය" යන්නෙන්–

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ හෝ 1981 අංක 74 දරන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක් හෝ බෞද්ධ පාලි විශ්ව විද්‍යාලය ;

(ආ) වෘත්තීය පුහුණුව හෝ යම් කර්මාන්තයක, වෘත්තියක හෝ සේවා නියුක්තියක නිරතව සිටින තැනැත්තන් සඳහා පුහුණුව ලබා දෙන්නා වූ යම් පිළිගත් ආයතනයක් අදහස් වන අතර යම් සංස්ථාගත විභාග පැවැත්වීමේ මණ්ඩලයක් ද ඊට ඇතුළත් වේ ;

"අධ්‍යාපන සේවා" යන්නෙන් යම් අධ්‍යාපන ආයතනයක් මගින් අධ්‍යාපනයට, වෘත්තීය පුහුණුවට හෝ නැවත පුහුණුවට අදාළව සලස්වනු ලබන අධ්‍යාපන සේවා අදහස් වේ ;

"පොල්මෑකරු" යන්නට අද්මිනිස්ත්‍රාත්කරුවකු ද ඇතුළත් වේ ;

"භාණ්ඩ" යන්නෙන් සියලු වර්ගවල චංචල හෝ නිශ්චල දේපළ අදහස් වන නමුත් ඊට මුදල් අයත් නොවේ ;

"අශක්‍යතාවට පත් තැනැත්තා" යන්නෙන් යම් බාලවයස්කරුවකු, උම්මත්තකයකු, මුග්ධයකු හෝ සිහිවිකල් තැනැත්තකු අදහස් වේ ;

"ආනයනය කිරීම" යන්නෙන් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට පිටතින් ශ්‍රී ලංකාවට භාණ්ඩ රැගෙන ඒම හෝ රේගු බන්ධිත ප්‍රදේශයකින් භාණ්ඩ ලැබීම අදහස් වන අතර බදු සහ වෙනත් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලබන විකිණීමක දී භාණ්ඩ මිල දී ගැනීම ද ඊට ඇතුළත් වේ ;

"යෙදවුම් බද්ද" යන්නෙන් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ-

(අ) බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ දී ලියාපදිංචි තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒ තැනැත්තා වෙත සපයනු ලබන භාණ්ඩ හා සේවා මත ඔහු විසින් ගෙවනු ලබන බද්ද ; හෝ

(ආ) ඒ තැනැත්තා විසින්, මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ, බදු අයකළ හැකි සැපයුම් කිරීමේ කාර්යය සඳහා ආනයනය මත ගනු ලබන භාණ්ඩ හෝ ගනු ලබන සේවා මත, ඔහු විසින් ගෙවන ලද බද්ද හෝ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අනුරු විධානය යටතේ විලම්බනය කරන ලද බද්ද,

එයින් අදහස් වේ.

"ජාත්‍යන්තර ප්‍රවාහන සේවා" යන්නෙන්

(අ) ශ්‍රී ලංකාවේ ස්ථානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයකට ;

(ආ) එම සේවා කරගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි, නැව්බඩු ගෙනැවිත් භාර දෙන්නකු (ෆ්‍රේට් ෆෝවඩර් කෙනකු) නිකුත් කළ ප්‍රවාහන ලේඛන (ඩොකියුමන්ට් ඔෆ් කැරේජ්) වලට අනුකූල නිශ්චිත ප්‍රවාහන කොන්ත්‍රාත්තුවක් යටතේ නම් මිස, ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයකින් ශ්‍රී ලංකාවේ ගොඩබසින ස්ථානය දක්වා ශ්‍රී ලංකාවේ යම් ස්ථානයකට ;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයකට

භාණ්ඩ හෝ මගින් ප්‍රවාහනයට සෘජුවම සම්බන්ධ යම් සේවාවක් අදහස් වේ ;

"නිෂ්පාදනය" යන්නෙන් භාණ්ඩයක් සෑදීම, කවර හෝ ක්‍රමයකින් භාණ්ඩයක කොටස් එකතු කිරීම හෝ සම්බන්ධ කිරීම, යම් භාණ්ඩයක් විකිණීම සඳහා පිළියෙල කිරීම, භාණ්ඩයක් ඇසිරීම, බෝතල්වලට පිරවීම, පෙට්ටිවලට දැමීම, කැපීම, පිරිසිදු කිරීම, ඔපදැමීම, එතීම, ලේබල් ගැසීම හෝ තොග හෝ සිල්ලර වෙළඳාම් ක්‍රියාකාරකමක දී විකිණීම හැර, විකිණීම් සඳහා වෙනත් ආකාරයකින් පිළියෙල කිරීම අදහස් වේ ;

"නිමැවුම් බද්ද" යන්නෙන් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධ වන විට, ඒ තැනැත්තා විසින් සපයන ලද හෝ සපයන ලදැයි සැලකෙන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ අයකළ යුතු බද්ද අදහස් වේ ;

"විවෘත වෙළඳපොළ වටිනාකම" යන්න, යම් දිනයක කරන ලද භාණ්ඩ හෝ සේවා හෝ සැපයුමක වටිනාකම සම්බන්ධයෙන් යෙදී ඇති විට, නිදහසේ අර්පණය කරන ලද්දා වූ ද ආශ්‍රිත තැනැත්තන් නොවන තැනැත්තන් අතර සපයන ලද්දා වූ ද ඉහත කී භාණ්ඩ හෝ සේවා සැපයුමට සමාන සැපයුමක්, ඒ හා සමාන පරිවේෂණ යටතේ ශ්‍රී ලංකාවේදී සපයන ලද්දේ නම් ඒ සැපයුම සඳහා සාමාන්‍යයෙන් ලබාගත හැකි ප්‍රතිෂ්ඨාවට සමාන වන්නා වූ ප්‍රතිෂ්ඨාවකින් ගෙවිය යුතු බද්ද අඩුකළ විට ලැබෙන ප්‍රතිෂ්ඨාව අදහස් වේ ;

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් නියම කිරීම අදහස් වේ ;

"සම්මත අනුප්‍රමාණය" යන්නෙන්, දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සැපයුම් හා සේවා නොවන වෙනත් බද්දට යටත් භාණ්ඩ හා සේවා සැපයුම්වලට අදාල වන්නා වූ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන අනුප්‍රමාණය අදහස් වේ ;

"භාණ්ඩ සැපයුම" යන්නෙන් භාණ්ඩවල අනන්‍ය අයිතිය, අයිතිකරු වශයෙන් හෝ යම් ලිඛිත නීතියක අධිකාරය යටතේ හෝ වෙනත් තැනැත්තකුට මාරුවීම අදහස් වන අතර ප්‍රසිද්ධ වෙන්දේසියේ භාණ්ඩ විකිණීම, කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ පවරා දීම, ණයක් පියවීම පිණිස භාණ්ඩ විකිණීම සහ බදු අය කළ හැකි ක්‍රියාකාරකමකින් බදු අයකළ නොහැකි ක්‍රියාකාරකමකට භාණ්ඩ මාරු කිරීම ද ඊට ඇතුළත් වේ ;

"සේවා සැපයුම" යන්නෙන් භාණ්ඩ සැපයුමක් නොවන නමුත් හානිපූරණයක් ලැබිය යුතු, බදු අය කළ හැකි ක්‍රියාකාරකමක දී දරන ලද යම් අලාභයක් ඇතුළත් ඕනෑම සැපයුමක් අදහස් වේ ;

"සැපයුම්කරු" යන්නෙන් භාණ්ඩ සහ සේවා සැපයුම සම්බන්ධයෙන් වන විට සැපයුම කරනු ලබන තැනැත්තා අදහස් වේ :

"බදු අය කළ හැකි කාලසීමාව" යන්නෙන්,-

(අ) (i) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි සැපයුම්වල වටිනාකම, පූර්වයෙන් වූ මාස දොළහ ඇතුළත දී රුපියල් මිලියන තිහක් ඉක්මවා ඇති අවස්ථාවක දී ; හෝ

(ii) යම් තැනැත්තකු විසින් ශුන්‍ය අනුප්‍රමාණගත කළ සැපයුම් කරනු ලබන අවස්ථාවක දී ; හෝ

(iii) 2001 අප්‍රේල් 01 දිනට පෙර, 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ උපලේඛනයෙහි (xxvii) වන හෝ (xxviii) වන විෂයයන්හි සඳහන් පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග යම් තැනැත්තකු ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාවේ ද,

(iv) යම් තැනැත්තකු විසින් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කොට මෙම පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ, 22 වන වගන්තියේ (6) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලවීමට භාරගත් අවස්ථාවක දී,

(v) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතේ උපලේඛනයේ (xxviii) විෂයයේ සඳහන් පරිදි වූ ගිවිසුමකට යම් තැනැත්තකු ඇතුළත්ව ඇති සහ ඒ ගිවිසුම අදාළවන ව්‍යාපෘතිය යටතේ බදු අයකළ හැකි සැපයුම් කිරීම 2001 මාර්තු 31 දින වන විට ආරම්භ කිරීමට ඒ තැනැත්තා අපොහොසත් වූ අවස්ථාවක දී

එක් මාසයක කාලසීමාවක් අදහස් වේ ;

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් නොවන තැනැත්තකු හෝ ශූන්‍ය අනුප්‍රමාණගත කළ සැපයුම් කරන්නා වූ ද කොමසාරිස් ජනරාල්වරයා ගේ අනුමතිය මත කාර්තුවක් පාසා වාර්තා ඉදිරිපත් කිරීමට එකඟවන්නා වූ ද තැනැත්තකු වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට එක් එක් වර්ෂයේ පිළිවෙලින් ජනවාරි මාසයේ පළමුවන දිනයෙන්, අප්‍රේල් මාසයේ පළමුවන දිනයෙන්, ජූලි මාසයේ පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාවක් අදහස් වේ.

"බදු අය කළ හැකි ක්‍රියාකරකම" යන්නෙන්–

(අ) සේවා නියුක්තියක ක්‍රියාවලිය තුළ හැර, ව්‍යාපාරයක්, වෙළෙඳාමක්, වෘත්තියක් හෝ රැකියාවක් ලෙස පවත්වාගෙන යන යම් ක්‍රියාකාරකමක් හෝ වෙළෙඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් හෝ ආයතනයක් ;

(ආ) සමාජ ශාලාවක්, සංගමයක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන්වන විට, ප්‍රතිෂ්ඨාවක් හා දායක මුදල ගෙවීම සඳහා එහි සාමාජිකයන්ට හෝ අන් අයට පහසුකම් සැලසීමක් ;

(ඇ) ඉහත (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් ක්‍රියාකාරකමක් හෝ පහසුකම් සැලසීමක් ආරම්භ කිරීමට, නැවැත්වීමට හෝ අදාළව කරනු ලබන යම් දෙයක් ;

(ඈ) යම් චංචල දේපළක් කුලියට හෝ කල්බදු දීමක් හෝ නිශ්චල දේපළක් කුලියට හෝ බද්දට දීමක් හෝ යම් දේපළක් පරිපාලනය කිරීමක් ;

(ඉ) පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන අයිතිය වැනි අස්පෘශ්‍ය දේපළ හෝ ඒ හා සමාන වෙනත් වත්කම් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති හෝ ඒ වත්කම්වල අයිතිකරුවන් ශ්‍රී ලංකාවේ වසතිය දරන අවස්ථාවක ඒවා ප්‍රයෝජනයට ගැනීම ;

"බදු අය කළ හැකි සැපයුම" යන්නෙන්, මේ පනත යටතේ බදු අය කළ හැකි වූ ද ශ්‍රී ලංකාවේ දී සලකනු ලැබුවා වූ ද හෝ සලකනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද නිදහස් සැපයුමක් හැර, ශූන්‍ය ප්‍රතිශතයට අයකරන ලද සැපයුමක් ද ඇතුළුව යම් භාණ්ඩ සහ සේවා සැපයුමක් අදහස් වේ.

**84.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පළමුවන උපලේඛනය

(i) (අ) අර්තාපල්, ලූණු, මිරිස් (සහල් සහ වී හැර) අනෙකුත් සියළු ධාන්‍ය, සහ රෝපන ද්‍රව්‍ය හැර සැකසුම් නොකළ කෘෂි නිෂ්පාදන ;

(ආ) සැකසුම් නොකළ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන ;

(ඇ) කවර ප්‍රභේදයක හෝ මස් හා එක් දින වයස් කුකුළු පැටවුන් ඇතුළු සජීවී පක්ෂීන් හැර සැකසුම් නොකළ සත්ව නිෂ්පාදන ;

(ඈ) සැකසුම් නොකළ මත්ස්‍ය නිෂ්පාදන ;

(ඉ) දැව හැර සැකසුම් නොකළ වන සම්පත් නිෂ්පාදන ;

(ඊ) කරදමුංගු, කුරුඳු, කරාබුනැටි, සාදික්කා, ගම්මිරිස්, කපාපු පොල්, රබර්, වී සහ බිත්තර වී,

සැපයුම හෝ ආනයනය.

(ii) සහල්, සහල් පිටි, තිරිඟු, තිරිඟු පිටි සහ බිත්තර සැපයුම හෝ ආනයනය ;

(iii) කවර වර්ගයකට හෝ අයත් පාන් සැපයුම හෝ ආනයනය ;

(iv) කිරි පිටිවලින් හෝ යම් ධාන්‍යයකින් නොසැදූ ද්‍රව කිරි සහ ළදරු කිරිපිටි සැපයුම හෝ ආනයනය ;

(v) ගුවන් යානා, හෙලිකොප්ටර, සැපයුම හා ආනයනය සහ ආනයනය කර මාස 12 ක් ඇතුළත නැවත අපනයනය කරන යම් පිරියත, යන්ත්‍රසූත්‍ර, උපකරණ තාවකාලිකව ආනයනය ;

(vi) අධ්‍යාපන ආයතනයක් හෝ රජයේ පාසල් හෝ රජයෙන් අරමුදල් සපයන පාසල් විසින් අධ්‍යාපන සේවා සැපයුම ;

(vii) චෙක්පොත්, වාර ප්‍රකාශන, සඟරා, පුවත් පත්, දිනපොත්, ලෙජර් පොත් හෝ අභ්‍යාස පොත් හැර අනිකුත් පොත් සැපයුම හෝ ආනයනය ;

(viii) භූමිතෙල්, කටාල ඉන්ධන සහ ගුවන්යානා ඉන්ධන සැපයුම හෝ ආනයනය ;

(ix) රජය, පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක් විසින් මහජන පුස්තකාල සේවා සැපයුම ;

(x) බොර ඛණිජතෙල් සැපයුම හෝ ආනයනය ;

(xi) පහත දැක්වෙන මූල්‍ය සේවා සැපයුම–

(අ) යම් ජංගම, තැන්පතු හෝ ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාම ;

(ආ) ව්‍යවහාර මුදල් හුවමාරුව ;

(ඇ) නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, එකතු කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම ;

(ඇ) යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ යම් හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම් පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහණය හෝ පිටසන් කිරීම ;

(ඉ) යම් සම කොටස් සුරැකුම්පතක් හෝ සහභාගි සුරැකුම් පතක් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ අයිතිය පැවරීම ;

(ඊ) සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගි සුරැකුම්පතක් නිකුත් කිරීම ප්‍රාරක්ෂණය කිරීම හෝ උප ප්‍රාරක්ෂණය කිරීම ;

(උ) යම් ණය මුදලක්, අත්තිකාරම් මුදලක් හෝ බැර පතක් සැපයීම ;

(ඌ) භාණ්ඩ සැපයුම්ලාභියාට දැනුම් දුන්නා වූ ද, වෙනම වැය බරක් කරනු ලැබුවා වූ ද පහසුකමක් වන කුලී සින්නක්කර කොන්දේසි සහිත විකිණීමක දී හෝ ණයට විකිණීමක දී එම කුලී සින්නක්කර ගිවිසුම යටතේ සපයන භාණ්ඩ, ඒ ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවේ පාවිච්චියට ගෙන තිබෙන අවස්ථාවක, වාරික වශයෙන් ණය මුදල ගෙවීමේ පහසුකම් සැලසීම ;

(එ) ජීවිත රක්ෂණය ; අග්‍රහාර රක්ෂණය සහ භෝග හා පශු සම්පත් රක්ෂණය ;

(xii) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රජයක, දූත මණ්ඩලයක හෝ යම් සංවිධානයක හෝ ඒ දූත මණ්ඩලයක හෝ සංවිධානයක හිමි කම් ලබන කාර්ය මණ්ඩලවල සාමාජිකයන්ට, ප්‍රති අපනයනය සඳහා වූ තාවකාලික පිළිගැනීමේ සහතිකයක් යටතේ ආනයනය කිරීම ද ඇතුළුව, භාණ්ඩ ආනයනය කිරීම හෝ භාණ්ඩ හා සේවා සැපයීම් ; එසේ වුව ද, ඉහත කී දූත මණ්ඩලවල, සංවිධානයේ ආයතනවල හා සාමාජිකයන්ගේ

ශ්‍රී ලංකාවෙන් නියුක්ත ප්‍රතිරූපකයන්ට ද අන්‍යොන්‍ය ලෙස ප්‍රතිලාභ තිබිය යුතු අතර, එලෙස ඒ ප්‍රතිලාභ කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගෙන තිබිය යුතු ය. 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ එවැනි හඳුනාගැනීම් මේ පනත යටතේ බලාත්මකව පවතී ;

(xiii) විදේශීය මුදලින් ගෙවීම සඳහා තීරුබදු රහිත සාප්පු වලට භාණ්ඩ ආනයනය කිරීම හෝ එම භාණ්ඩ සැපයුම ;

(xiv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව හෝ පළාත් සභාවකට අයත් පාවිච්චි නොකරන ලද තැපැල් හා ආදායම් මුද්දර ආනයනය කිරීම හෝ සැපයුම ;

(xv) රේගු ආඥා පනතේ 107 වන වගන්තිය යටතේ සාදන ලද මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීමේ) නියෝග යටතේ බදු රහිතව නිෂ්කාශනය කරගැනීමට හිමිකම් ඇති යම් භාණ්ඩයක් හෝ රේගු ආඥාපනතේ 'අ' උපලේඛනයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි නැවත ආනයනය කිරීමේ සහතිකය මත බදු රහිතව ලබාගත් යම් භාණ්ඩයක් හෝ නැවක ගබඩාවේ ප්‍රයෝජනය සඳහා බැඳුම්කරයක් නොමැතිව නිෂ්කාශනය කරන භාණ්ඩ ආනයනය කිරීම ;

(xvi) මුදල් විෂයය භාර අමාත්‍යවරයා සෑහීමට පත් වී ඔහු විසින් අනුමත කරන ලද භාණ්ඩ යම් සංවිධානයක් විසින් ස්වාභාවික හෝ වෙනත් විපත් නිසා ඇති වූ ආපදාවලට සහන සැලසීම සඳහා හෝ ආගමික හෝ පුණ්‍ය කාර්ය සඳහා පිටරට තැනැත්තන්ගෙන් හා සංවිධානවලින් තෑගි වශයෙන් ලැබී ආනයනය කරන හෝ විදේශ සංවිධාන වලින් අරමුදල් යොදා කෙළින්ම භාණ්ඩ සැපයීම ;

(xvii) ජනතා මගී ප්‍රවාහන සේවා සැපයීම (ගුවන් හෝ ජල ප්‍රවාහන සේවා හෝ විනෝද චාරිකා වශයෙන් හෝ සංචාරකයන් ප්‍රවාහනය පිණිස හෝ කුලී රථ සේවා

සැපයීම පිණිස හැර) හෝ ජනතා මගී ප්‍රවාහන සේවා සඳහා මගී ආසන විසිඅටකට නොඅඩු මෝටර් කෝච් රථ සඳහා කල්බදු පහසුකම් සැපයීම ;

(xviii) (205 වන අධිකාරය) විදුලිබල පනතේ අර්ථ කථනය, කර ඇති පරිදි එක් පාරිභෝගිකයකුට මසකට කිලෝවොට් පැය 30 ක් නොඉක්මවන පරිදි විදුලිබලය සැපයීම ;

(xix) (අ) 1996 මැයි මස 16 වන දිනට පෙර හෝ ;

(ආ) මුළු පිරිවැය රුපියල් මිලියන 500 ට නොඅඩු පිරිවැයක් ඇති ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් 1998 අප්‍රේල් මස පළමුවන දිනට පෙර හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු විසින් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නියම කර ඇති යම් භාණ්ඩයක්, ඒ ගිවිසුමේ සඳහන් පරිදි ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ හෝ ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ දිනය දක්වා යන දින දෙකින් කලින් එළඹෙන දිනය දක්වා ආනයනය කිරීම ;

(xx) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු විසින් ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු ඒ තැනැත්තා විසින් කරනු ලබන්නේ නිදහස් කරන ලද සැපයුම් පමණක් වන විට, ඒ ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස, ව්‍යාපෘතියට අදාළ භාණ්ඩයක් ලෙස නියම කර ඇති භාණ්ඩයක්.

(අ) 2002 අගෝස්තු 1 දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ; හෝ

(ආ) ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තෙක්,

යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා ආනයනය කිරීම ;

(xxi) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ආගමන කවුළුවට ඔබ්බෙහි පිහිටා ඇති ආපන ශාලාවක සේවා සැපයුම ;

(xxii) ශ්‍රී ලංකාවේ තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට, ඒ වෙනත් තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පරිභෝජනය කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම පිණිස රුපියල් වලින් ගෙවීම් ලබන සේවා සැපයීම ;

(xxiii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති ව්‍යවසායක් විසින් මුළු පිරිවැය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන හා තනිකරම නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදු දීම සහ කුලියට දීම සඳහා වන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම හෝ කුලියට දීම හැර, පදිංචිය සඳහා නිවාස ඉඩ පහසුකම් සැපයීම, බදුදීම හෝ කුලියට දීම ;

(xxiv) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 2001 අප්‍රේල් 01 වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති වෛද්‍ය ආයතනයක් විසින්, මුළු පිරිවැය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට අඩු නොවන, ඒ ගිවිසුම අදාළ ව්‍යාපෘතියක් මගින් සෞඛ්‍ය ආරක්ෂක සේවා සැපයීම හැර, සෞඛ්‍ය ආරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් හෝ සියලු සෞඛ්‍යාරක්ෂක සේවා සැපයීම ;

(xxv) මුතු, දියමන්ති, ස්වභාවික හෝ කෘතිම මැණික් හෝ බාලවර්ගයේ මැණික් ගල්, දියමන්ති කුඩු වර්ග, මහඟු ලෝහ හෝ මහඟු ලෝහ ආවරණයක් සහිත ලෝහ, සහ රත් කාසි සැපයුම හෝ ආනයනය ;

(xxvi) යන්ත්‍රෝපකරණ, වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය සහ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ සහ ගිලන්රථ ද ඇතුළු ආම්පන්න හා උපාංග සැපයුම හෝ ආනයනය ;

(xxvii) මනුෂ්‍ය ශරීරයේ දෝෂයක් හෝ ආබාධයක් පිරිමැසීම සඳහා පළඳින හෝ ගෙන යන හෝ බද්ධ කරනු ලබන කෘත්‍රිම අවයව, අත්වාරු, ශ්‍රවනාධාර සහ ඒ ආධාරක හෝ වෙනත් උපකරණ සහ උපාංග සැපයීම හෝ ආනයනය ;

(xxviii) රෝද පුටු, ක්ෂුද්‍ර ජීවී වර්ධනය සඳහා පිළියෙල කරන ලද වගා මාධ්‍ය. සංජනනාත්මක හෝ රසායනාගාර ප්‍රතිකාරක, ශල්‍යකර්ම අත්මේස්, ස්පර්ශක කාච, X කිරණ තළ, අන්ධයන් සඳහා සුදු සැරයටි සහ බ්‍රේල් යතුරු ලියන හා කොටස් සැපයීම හෝ ආනයනය ;

(xxix) රජය, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලබන භූමදාන හෝ ආදාහන වලට අදාළ සේවා සැපයීම ;

(xxx) සේවායෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තයන්ට ඔවුන්ගේ සේවා ස්ථානයේ දී නොමිලේ හෝ සහන මිලට කෑම සැපයීම ;

(xxxi) යෙදවුම් බද්දකට අවසර දී නොමැති වාහනයක් හෝ සේවායෝජකයකු විසින් සේවා නියුක්තයන්ට ඔවුන්ගෙන් නිවාසවලින් සේවා ස්ථානවලට යාම ඊම සඳහා සපයා ඇති මෝටර් කෝච් රථයක් හෝ යොදා ගෙන සේවා යෝජකයකු ඔහුගේ සේවා නියුක්තයින්ට නොමිලේ හෝ සහන මිලට ප්‍රවාහන සේවා සැපයීම ;

(xxxii) රු. 10,000/ ට නොවැඩි වටිනාකමකින් යුත්, පෞද්ගලික අයිතම සහ ව්‍යාපාර සම්බන්ධ සාම්පල් පාර්සල් තැපැලෙන් හෝ බඩු ගෙනවිත් භාර දෙන්නකු මගින් ආනයනය ;

(xxxiii) (සුවඳ විළවුන් හැර) ඖෂධ නිෂ්පාදන සහ අමුද්‍රව්‍ය සැපයීම, හෝ ආනයනය ;

(xxxiv) ආයුර්වේද ඖෂධ නිසන්ටුවට අයත් ආයුර්වේදීය සංයෝග ; හෝ සුවඳ විළවුන් සංයෝග නොවන ආයුර්වේදීය සංයෝග ; හෝ සුවඳ විළවුන් සංයෝග නොවන යුනානි, සිද්ධ හෝ හෝමියෝපතික සංයෝග සහ එවැනි සංයෝග සඳහා අමුද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය ;

(xxxv) කෘෂිකාර්මික ට්‍රැක්ටර් සැපයුම හෝ ආනයනය ;

(xxxvi) කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සැපයුම හෝ ආනයනය ;

### දෙවන උපලේඛනය

(i) (205 වන අධිකාරය) විදුලිබල පනතේ අර්ථකථනය කර ඇති පරිදි, එක් පාරිභෝගිකයකු සඳහා මසකට කිලෝවොට් පැය 30 ක් ඉක්මවන විදුලිබලය සැපයුම සහ ජාතික විදුලිබල පද්ධතියට තොග වශයෙන් විදුලි බලය සැපයුම ;

(ii) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් හෝ උප කොන්ත්‍රාත්කරුවන් විසින් සේවා සැපයුම ;

(iii) හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ ඒ හා සමාන ආයතන හා රට තුළට එන සංචාර හා සම්බන්ධ නියෝජිතයන් විසින් සේවා සැපයුම ;

(iv) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත හෝ ශ්‍රී ලංකාවට ආනයනය කළ (වීඩියෝ චිත්‍රපට හැර) සිනමා චිත්‍රපට සැපයීම, එවැනි චිත්‍රපට ආනයනය, එවැනි චිත්‍රපට සහ නාට්‍යමය නිෂ්පාදන ප්‍රදර්ශණය ;

(v) පළමුවන උපලේඛනයේ (vi) වන විෂයයේ සඳහන් සේවා නොවන අධ්‍යාපන සේවා සැපයුම ;

(vi) පොල් පුන්නක්කු, ඉස්සන් සඳහා කෑම සහ කුකුළුකෑම සැපයුම හෝ ආනයනය කිරීම ;

(vii) තේ, පොල්තෙල්, අර්තාපල්, ලූණු, මිරිස්, කොප්පරා, එළවළු බීජ (බිත්තර වී හැර) රෝපණ ද්‍රව්‍ය, සජීව පක්ෂීන්, දිනක් වයස කුකුළු පැටවුන්, කුකුළුමාංශ කොටස් ඇතුළුව පිසීමට සකස් කල කුකුළු මස් සහ වෙනත් කවර හෝ ප්‍රභේදයක සකස් නොකළ මස් සැපයීම හෝ ආනයනය ;

(viii) සහරා සහ වාර සහරා සැපයුම හෝ ආනයනය කිරීම ;

(ix) ළදරු කිරි පිටි හැර පිටිකළ කිරි, උකු කිරි සහ රනිල ඇට වර්ග සැපයුම හෝ ආනයනය ;

(x) සීනි, හකුරු සහ සක්කර සැපයුම හෝ ආනයනය කිරීම ;

(xi) කරවල, උම්බලකඩ, රොක් පොස්පේට් ඇතුළුව පොහොර සහ ජලය සැපයුම හෝ ආනයනය ;

(xii) පැට්‍රෝල්, ඩීසල් සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් සැපයුම හෝ ආනයනය ;

(xiii) පළමුවන උපලේඛනයේ (xvii) විෂයය යටතේ විස්තර කර තිබෙන පරිදි පොදු මගී ප්‍රවාහනය සඳහා ප්‍රයෝජනයට ගන්නා මගී ආසන 28 ක හෝ ඊට වැඩි ආසන පහසුකම් සහිත මෝටර් කෝච් රථ සහ එවැනි මෝටර් කෝච් රථ සඳහා චැසි හෝ බොඩි සැපයුම හෝ ආනයනය කිරීම ;

(xiv) පොටෝ වෝල්ටැයික්, සූර්ය කෝෂ, එනර්ජි එෆිශන්ට් කම්පැක්ට් ෆ්ලොරොසන්ට් ලාම්පු සහ එම ලාම්පු සඳහා අමතර කොටස් සහ ගෘහ සූර්යතාප විදුලිබල පද්ධති සැපයුම හෝ ආනයනය ;

(xv) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, විධිවිධාන සලසා තිබෙන පරිදි, විදේශගතවීමට බලාපොරොත්තුවන්නන්ගෙන් අයකර ගන්නා ගාස්තුවලට අදාළ සේවා සැපයුම ;

(xvi) විදුලි පංකා සහ ඒවායේ කොටස්, වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, ශීතකරණ සඳහා කැබිනට්, පිහන් සේදුම් යන්ත්‍ර (ගෘහස්ත මෝස්තරය) පුද්ගලික බර කිරුම් යන්ත්‍ර, තණ පිටි හෝ ක්‍රීඩාපිටි රෝලර් සහ අමතර කොටස්, තණ කපන යන්ත්‍ර සහ ඒවායේ කොටස් ගෘහස්ථ රෙදි සෝදන යන්ත්‍ර, ගෘහස්ථ මෝස්තරයේ මහන මැෂින්, හැර කාර්මික යන්ත්‍ර සූත්‍ර, විදුලි මෝටර් සහ විදුලිජනක යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර කට්ටල, හා රෝටරි කන්වර්ටර් සහ එම මෝටර් සඳහා කොටස් ජනක යන්ත්‍ර, ජනක යන්ත්‍ර කට්ටල සහ කන්වර්ටර් සඳහා කොටස් සැපයුම හෝ ආනයනය ;

(xvii) තනිවම හෝ වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් සමඟ එක්ව වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමේදී, ඒ සියලු තැනැත්තන් ඒ වෘත්තියේ පිළිගත් වෘත්තීය පුද්ගල මණ්ඩලයක සුදුසුකම් දරන සාමාජිකයන් නම් හෝ ඒ සියලු තැනැත්තන්, සාහිත්‍ය, කලා, සංගීත, හෝ වෙනත් යම් කලාශිල්ප ක්ෂේත්‍රයක රැකියාවක් කරගෙන යන්නවුන් නම්, එවැනි වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමේදී සේවා සැපයුම ;

(xviii) 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු විසින් කල්බදු පහසුකම් සැපයුම ;

(xix) භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගොඩබිම් ප්‍රවාහන සේවා සැපයුම ;

(xx) සමිතියක, සමාජ ශාලාවක, හෝ සංගමයක සාමාජිකයන්ගෙන් සාමාජික ගාස්තු හෝ ඒ හා සමාන ගාස්තු එකතු කිරීම ;

(xxi) බයිසිකල් සහ මෝටර් බයිසිකල් සැපයුම හෝ ආනයනය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.